centre for poverty analysis



# ගැටුම්කාරී තත්ත්වයෙන් මිදුණු ජනයා යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලියේ දී ලද අත්දැකීම්

පශ්චාත් ගැටුම්කාරී සමයේ යුක්තිය පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයකි

ප්‍රශාන් තලයසිංගම්

2007 නොවැම්බර්

කාර්ය පත්‍රිකා මාලාව අංක 12 - 2007

# ගැටුම්කාරී තත්ත්වයෙන් මිදුණු ජනයා යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලියේ දී ලද අත්දැකීම්

පශ්චාත් ගැටුම්කාරී සමයේ යුක්තිය පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයකි

ප්‍රශාන් තලයසිංගම්

2007 නොවැම්බර්

කාර්ය පත්‍රිකා මාලාව අංක 12 - 2007

ගැටුම්කාරී තත්වයෙන් මිදුණු ජනයා යථා තත්වයට පත්වීමේ ක්‍රියාවලියේ දී ලද අත්දැකීම්

පශ්චාත් ගැටුම්කාරී සමයේ යුක්තිය පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයකි.

© දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2006

ප්‍රථම ප්‍රකාශනය 2006

ISBN : 955-1040-30-9
ISSN : 1391-9946

ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය - ග්‍රන්ථ නාමාවලි ප්‍රකාශන දත්ත

තලයසිංගම් ප්‍රශාන්

ගැටුම්කාරී තත්වයෙන් මිදුණු ජනයා යථා තත්වයට පත්වීමේ ක්‍රියාවලියේ දී ලද අත්දැකීම්: පශ්චාත් ගැටුම්කාරී සමයන්හි යුක්තිය පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයකි. ප්‍රශාන් තලයසිංගම් - කොළඹ : දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2006, පිටු 26 කි. සෙ.මී. 29)

කාර්ය පත්‍රිකාමාලාව - අංක 12

ISBN : 955–1040–30–9 මිල රු. 300/=

i. 303.6 DDC ii. මාතෘකාව

1. ගැටුම

පිටකවර නිර්මාණය : සීමාසහිත කරුණාරත්න සහ පුත්‍රයෝ

මුද්‍රණය : සීමාසහිත කරුණාරත්න සහ පුත්‍රයෝ
67, කාර්මික ජනපදය,
කටුවාන පාර,
හෝමාගම,
ශ්‍රී ලංකාව.

ප්‍රකාශනය : දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ ප්‍රකාශනමාලාවේ දනට මතු දක්වෙන ගණයන්හි ප්‍රකාශන ඇතුළත් වේ: අධ්‍යයනයන්, සංස්කරණය කළ වෙළුම්, කාර්ය පත්‍රිකා සහ ලුහුඬින් කරුණු දක්වීමේ පත්‍රිකා

**ප්‍රශාන් තලයසිංගම්** දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයෙහි දරිද්‍රතාව සහ ගැටුම් පිළිබඳ වැඩසටහන් සම්බන්ධයෙන් කටයුතු කරන ජ්‍යෙෂ්ඨ වෘත්තිකයෙකි. ඔහු එංගලන්තයේ සසෙක්ස් සරසවියේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකි.

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය වූ කලී ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවට අදාළ ගැටළු වඩාත් මැනවින් අවබෝධ කර ගැනීම ප්‍රවර්ධනය කරන ස්වාධීන වෘත්තීය සේවා සපයන්නෙකි. දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ සේවා නැඹුරුව කේන්ද්‍රගත ව ඇත්තේ දරිද්‍රතාව අඩුකරලීම පිළිබඳ කටයුතුවල නිරත සංවිධාන සහ වෘත්තිකයන් කරා විහිද ගිය ව්‍යවහාරික පර්යේෂණ, උපදේශන සේවා, පුහුණුව සහ සංවාද හා හුවමාරුව යන අංශ හතර කෙරෙහිය.

ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ දෙපාර්තමේන්තුවේ (DFID) ආධාරයෙන් පවත්වාගෙන යන මෙම අධ්‍යයනය, දරිද්‍රතාව සහ ගැටුම පිළිබඳ වන වැඩසටහන්මාලාවේ එක් වැඩසටහන් ක්‍රියාකාරකමකි. DFID යනු සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ දරිද්‍රතාව අඩු කරලීම පිළිබඳ වගකීම දරන, බ්‍රිතාන්‍ය රජය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුවය. එම දෙපාර්තමේන්තුව සිය කටයුතු කර ගෙන යනු ලබන්නේ රජය, සිවිල් සමාජය, පෞද්ගලික අංශය සහ සෙසු වෙනත් ආයතන සමඟ හවුල්කාරීත්වයකින් යුතුවය. දරිද්‍රතාවට තුඩු දී ඇති, ඊට යටින් දිවෙන හේතු සම්බන්ධයෙන් කටයුතු කිරීම උදෙසා යොමුව ඇති දීර්ඝකාලීන වැඩසටහන්වලට ඉන් ආධාර සැපයෙනු ලැබෙන්නේය. ස්වාභාවික මෙන්ම මිනිසා විසින් නිර්මිත හදිසි ආපදා අවස්ථාවල දී ද DFID ප්‍රතිචාර දක්වනු ලැබේ.

## ස්තුති කිරීම්

ප්‍රජාවන් වෙත පිවිසීම පිණිස අපට උපකාර කිරීම සහ මෙම සංවේදී ගැටළු අධ්‍යයනය කිරීම පිණිස ඊට අදාළ සහභාගීවන්නන් සමඟ සාකච්ඡා කිරීමට ඉඩ සලසා දීම සම්බන්ධයෙන් මන්නාරමේ සාමය උදෙසා සම්පත් ව්‍යාපෘතිය ද (Resources for Peace Project),

සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ ඒවාට පහසුකම් සැලසීම සහ මෙම අධ්‍යයනයට පදනම් වූ තොරතුරු සපයා දීම සම්බන්ධයෙන් මොහමඩ් මුනාස්, ගයත්‍රී ලොකුගේ, සරස්වතී පෝල්රාජ් සහ ලියෝ රෙජිනෝල්ඩ් රෙජිස් යන අයගෙන් සමන්විත ක්ෂෙත්‍ර පර්යේෂණ කණ්ඩායම ද

අවසාන පර්යේෂණ නිබන්ධය මනා ගැළපීමෙන් යුත්, සන්නිවේදනාත්මක එකක් බවට පමුණුවා ලීම සම්බන්ධයෙන් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයෙහි කාර්යමණ්ඩලය ද

අධ්‍යයනය සඳහා සහභාගී වූ ප්‍රජාවන් ද

යන සියල්ලන් විසින් මෙම ප්‍රයත්නයේ දී පිරිනමන ලද දායකත්වයට මම මාගේ කෘතඥතාපූර්වක ස්තුතිය පුද කරමි.

## කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| රඅපු | - | රට තුළ අවතැන් වූ පුද්ගලයන් |
| ජාඉසසය | - | ජාත්‍යන්තර ඉස්ලාමීය සහනාධාර සංවිධානය |
| අගිම | - | 2002 වසරේ ලංකාණ්ඩුව සහ ද්‍රවිඩ ඊලාමයේ කොටි සංවිධානය අතර අත්සන් තැබූ අවබෝධතා ගිවිසුම |
| එල්.ටී.ටී.ඊය | - | ද්‍රවිඩ ඊලාමයේ කොටි සංවිධානය |

## පටුන


සාරාංශය 1

1. හැඳින්වීම සහ තාර්කිකභාවය 3
   - මන්නාරම තෝරා ගත්තේ මක්නිසාද? 3

2. සහසම්බන්ධතාව සකසා ගැනීම 4
   - යුක්තිය පිළිබඳ නිර්වචනයන් 4
   - සාමය පිළිබඳ නිර්වචනයන් 5
   - මානව සුරක්ෂිතභාවය 6
   - සන්ධානගත වීම පිළිබඳ නිර්වචනයන් 7
   - නිගමනය 8

3. අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රජාවන් 9

4. ක්‍රමවේදය 9

5. ගැටුමට අදාළ අත්දැකීම් 10
   - ගැටුම පිළිබඳ අත්දැකීම් - KRI 10
   - ගැටුම පිළිබඳ අත්දැකීම් - MSL 10
   - ගැටුම පිළිබඳ අත්දැකීම් - NNT 11

6. යුක්තිය සහ යථා තත්ත්වයට පත් වීම 13
   - පහළ මට්ටමේ සමාජ-ආර්ථික තත්වය 13
   - මධ්‍යම මට්ටමේ සමාජ-ආර්ථික තත්වය 16
   - ඉහළ මට්ටමේ සමාජ-ආර්ථික තත්වය 18
   - මූල් නිගමනයන් 20

7. සහසම්බන්ධතාව කෙරෙහි නැවත යොමුවීම 20
   - යුක්තිය පිළිබඳ නිර්වචනයන් 20
   - සාමය පිළිබඳ නිර්වචනයන් 21
   - මානව සුරක්ෂිතභාවය 21

8. සාකච්ඡා ඉදිරියට ගෙන යෑම 23

9. පශ්චාත් ගැටුම්කාරී සමයෙහි යුක්තිය පිළිබඳ සංකල්පය කෙරෙහි නැවත යොමුවීම 24

ග්‍රන්ථ නාමාවලිය 25

**සාරාංශය**

මෙම අධ්‍යයනයෙන් සිදු කෙරෙන්නේ ගැටුම්වලට පසුකාලීන සමයෙහි පවතින යුක්තිය පිළිබඳ ව අවබෝධ කර ගැනීමත්, ගැටුම්වලින් හානියට පත් ජනයාට අදාළ ව ඉන් හැඟවෙන්නේ කුමක් ද යන්න සොයා බැලීමත්ය. යුක්තිය සොයා යෑමේ දී සමාජ - ආර්ථික තත්ත්වය ඒ කෙරෙහි බලපාන ආකාරය සහ තක්සේරු කර ඇති ආකාරයට යුක්තියේ ස්වරූපය සහ එය ඉෂ්ට කෙරෙන නිසි අවස්ථාව නිගමනය කිරීමට මෙය උපකාරී වන්නේ ද යන්නත් මෙම අධ්‍යයනයෙන් සොයා බැලෙන්නේය. ගැටුමින් හානියට පත් ජනයා ස්වකීය අත්දැකීම්වලින් මිදී යථා තත්ත්වයට පත් වන්නේ කෙසේ ද යන්නත්, එසේ යථා තත්ත්වයට පත් වීමේ දී යුක්තියේ කාර්යභාරය කුමක් ද යන්නත් මෙමගින් විශේෂයෙන් විමසා බැලෙනු ඇත.

මෙම අධ්‍යයනයේ කේන්ද්‍රීය උපකල්පනය වන්නේ සමාජ - ආර්ථික තත්ත්වය හානියට පත් ජනයා පතන ආකාරයේ යුක්තිය කෙරෙහි සහ ඔවුන් එය සොයා යන අවස්ථාව කෙරෙහි බලපෑමක් සිදු කරන බවය.

මෙම අධ්‍යයනයෙහි දී යුක්තිය නිර්වචනය කර ඇත්තේ අවසානයක් වශයෙන් නොව හානියට පත් ප්‍රජාවන් සහ එයට සම්බන්ධව සිටින සෙසු අය විසින් නිරතුරු ව වර්ධනය කරන්නා වූ ක්‍රියාවලියක් වශයෙනි. එය දකිනු ලබන්නේ වඩාත් පුළුල් සමාජ සාධාරණත්වයක් කරා යොමු වන්නා වූ සමාජ සම්බන්ධතාමාලාවක් වශයෙනි. ඉන් ඉදිරිපත් කෙරෙන්නේ ස්ථාවර ආශ්‍රිත අර්ථයන් සහ අදහස් මාලාවකින් සමන්විත දෘඪ සංකල්පයන් වෙනුවට වඩාත් නම්‍යශීලී හා අඩු විධානාත්මක ආකාරයේ විමසා බැලීමකි.

පශ්චාත් - ගැටුම් පිළිබඳ අධ්‍යයනයන්හි භාවිතයේ යෙදෙන සමහර මූලික පද පිළිබඳ ව නව යථාදෘෂ්ටීන් මෙම පත්‍රිකාව මඟින් ඉදිරිපත් කෙරේ. මෙම අධ්‍යයනය සිදු කරන ලද්දේ බිඳෙනසුළු සෘණාත්මක සාමයේ සිට ප්‍රජාව වඩාත් ධනාත්මක සාමයක් කරා ඇදෙමින් සිටිතැයි පෙනී ගිය සමයකදී ය. මෙම සෘණාත්මක සාමයේ ඇති වැදගත්කම සහ එය ගැටුම්කාරී තත්ත්වයෙන් මිදී යථා තත්ත්වය කරා පත් වීමේ දී බලපා ඇති ආකාරය සහ අඛණ්ඩ ව එයට දායක වී ඇති ආකාරයත් වත්මන් පර්යේෂණය මඟින් වෙසෙසින් දැක්වේ.

මානව සුරක්ෂිතභාවය පිළිබඳ සංකල්පයට ආවේණික අඩුලුහුඬුකම් ද මෙම අධ්‍යයනය මඟින් හුවා දැක්වේ. මානව සුරක්ෂිතභාවය පශ්චාත්-ගැටුම්කාරී අවධිය යථා තත්ත්වයට පත් කිරීමේ අංශයෙහි ලා වඩාත් ප්‍රබල සංකල්පයක් බවට පත් වෙමින් තිබෙන අතර, 'සාධාරණය' සහ 'සන්ධානගත වීම' මෙන් නොව 'මානව සුරක්ෂිතභාවය' සැලකිය යුත්තේ අවසානයක් වශයෙන් නොව, සමාජ විපර්යාසයට අදාළ මනදගාමී ක්‍රියාවලියක් ලෙසින් බව මෙම අධ්‍යයනයෙන් පෙන්වා දී තිබේ. කාලාතික්‍රමණයෙන් ('කාලයාගේ ඇවෑමෙන්') යන්නෙහි ඇති වැදගත්කම ද, ස්වකීය අත්දැකීම්වලින් මිදී ඉදිරියට යෑමට ජනයාට ඉඩ සැලසීම සම්බන්ධයෙන් එය විශාල කාර්යභාරයක් ඉටු කර ඇති ආකාරය ද මෙම පර්යේෂණයෙන් විදහා දැක්වේ.

ගැටුම්වලින් හානියට පත් ප්‍රජාවන් තම ගැටළු නිරාකරණය කර ගැනීමට යුක්තිය පතා සිටින ආකාරය කෙරෙහි ඔවුන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය සහ බාහිර මැදිහත්වීම සැබෑ වශයෙන් විශාල වශයෙන් බලපා නොමැති බව මෙම පර්යේෂණය මඟින් අනාවරණය කෙරේ. මෙම සෑම ප්‍රජාවක් ම සම්මත ව පවත්නා යුක්තිය පිළිබඳ ක්‍රමයන් තෝරා ගැනීමේ දී ඔවුන් වඩාත් සමීපව බැඳී සිටින්නේ ප්‍රජාවන්ගේ සාමූහික අත්දැකීම්, අනන්‍යතාව සහ ඔවුන් දන්නා හා ගරු කරන ව්‍යුහයන් සහ ආයතන සමඟ ය. කෙසේ වුව ද, ධනය, සම්බන්ධතා ජාලයන් සහ තත්ත්වය යන දේ යුක්තිය සහ යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන්ට පිවිසීම කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ ව ප්‍රජාවන් දක්වන ප්‍රතිචාර මඟින් ධනවත් සහ මනා සම්බන්ධකම් තිබෙන අයට නීති පද්ධතියට පිවිස පොලීසියට කරුණු ඉදිරිපත් කිරීමට ඇති හැකියාව පිළිබඳ ඔවුන් දරන කිසියම් සංජානනයන් අනාවරණය වුව ද, මෙය දකිනු ලබන්නේ ඉතා ම යෝග්‍ය අවස්ථාවක් නැතහොත්, 'අනෙක් පැත්ත' පිළිබඳ දැක්වීමක් වශයෙනි. පර්යේෂණය ඉලක්ක කොට ඇත්තේ තමන් හමුවේ තිබෙන ව්‍යුහයන්හි සීමාව තුළ ඔවුන් පළ කරන තම තේරීම් කෙරෙහිය.

සම්මුඛ සාකච්ඡාවල දී ගැටුමින් හානියට පත් ප්‍රජාවන් විසින් පැහැදිලි ව දක්වන ලද්දේ යුක්තිය පසිඳලීම සඳහා විධිමත් නෛතික ක්‍රියාවලියක් අවශ්‍යයෙන් ම ඕනෑ වේ යැයි තමන් නොසිතන බවත්, ස්වකීය ගැටළු වඩාත් ප්‍රජාමූලික වූ ආයතනවලට යොමු කළ හැකි ආකාරයේ ප්‍රශ්න රාශියකින් යුත් ඒවා වන බවත් ය.

මෙම සාකච්ඡා ව තවදුරටත් ඉදිරියට ගෙන යෑමට මෙම පත්‍රිකාවෙන් යෝජනා කෙරෙන අතර ම, වෙනත් ආයතන හඳුන්වා දීමට ප්‍රයත්න දැරීමට වඩා ප්‍රජාවන් තම ප්‍රශ්න විසඳා ගැනීමට යොදා ගනු ලබන දැනට තිබෙන ආයතන වඩාත් ශක්තිමත් කරන මෙන් නිර්දේශ කරනු ලැබේ. එසේ ම ප්‍රජාවන්ට තම ජීවනෝපායන්

වැඩිදියුණු කර ගැනීමට ඉඩ සලසාලමින් ඒ මාර්ගයෙන් ඔවුන් යථා තත්වයට පමුණුවමින් ඊට අදාළ තත්වයන් වැඩිදියුණු කරන ව්‍යාපෘති හෝ වැඩසටහන් මත පදනම් වූ පශ්චාත් ගැටුම් මූලාරම්භයන් ශක්තිමත් කිරීමට ද මෙම අධ්‍යයනයෙන් නිර්දේශ කෙරේ.

අවසාන නිර්දේශය වන්නේ ගැටුමින් හානියට පත් ප්‍රජාවන්ගෙන් ලැබෙන තොරතුරු සහ ඔවුන්ට යථා තත්වයට පත් වීමට හැකි වී තම ගැටළු විසඳා ගැනීම පිළිබඳ ව කටයුතු කළ ආකාරය ගැන අදහස් ඒ හා සමාන ආකාරයේ අභියෝගවලට මුහුණ පා සිටින වෙනත් ප්‍රජාවන් සමඟ හවුලේ බෙදා හදා ගත යුතු බවය. පර්යේෂණයෙන් ඉස්මතු වූ කරුණ වන්නේ ගැටුමට මැදිහත් වී සිටින ප්‍රධාන පක්ෂ දෙක අතර පවත්නා විධිමත් සාම ක්‍රියාවලියට සමාන්තරව හානියට පත් ප්‍රජාවන්ගේ මට්ටමට වඩාත් සමීප වන ආකාරයට යථා තත්වයට පත්වීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතින බවයි. ප්‍රජා මට්ටමේ ආයතනවලින් ආධාර ලැබ, දැනට පවත්නා බිඳෙනසුලු සාමයෙන් ඉඩ සැලසී ඇති මෙම ක්‍රියාවලිය රැඳී පවතින්නේ හානියට පත් ප්‍රජාවන්ගේ ජීවිකාව යථා තත්ත්වයට පත්වීමේ තත්ත්වය මතය.

සාම ක්‍රියාවලියට හවුල් සෙසු අය සහ ක්‍රියාකාරීන් විසින් ද මෙම ක්‍රියාවලිය පිළිගන්නා ලෙසත්, සංවර්ධනයට අදාළ මැදිහත් වීම් මගින් හැකි සෑම විටක ම එයට ආධාර සපයමින් එය වර්ධනය කරන ලෙසත් මෙම පර්යේෂණය ඉල්ලා සිටී.

## 1. හැඳින්වීම සහ තාර්කිකභාවය

මෙම අධ්‍යයනයෙන් සිදු කෙරෙන්නේ ගැටුම්වලට පසුකාලීන සමයෙහි පවත්නා 'යුක්තිය' පිළිබඳ ව අවබෝධ කර ගැනීමත්, ගැටුම්වලින් හානියට පත් ජනයා සම්බන්ධයෙන් ඉන් හැඟවෙන්නේ කුමක් ද යන්න සොයා බැලීමත් ය. යුක්තිය සොයා යෑමේ දී සමාජ - ආර්ථික තත්ත්වය ඒ කෙරෙහි බලපාන ආකාරය සහ තක්සේරු කර ඇති ආකාරයට යුක්තියේ ස්වරූපය සහ එය ඉෂ්ට කෙරෙන නිසි අවස්ථාව නිගමනය කිරීමට මෙය උපකාරී වන්නේ ද යන්නත් මෙම අධ්‍යයනයෙන් සොයා බැලෙන්නේය. ගැටුමින් හානියට පත් ජනයා ස්වකීය අත්දැකීම්වලින් මිදී යථා තත්ත්වයට පත් වන්නේ කෙසේ ද යන්නත්, එසේ යථා තත්ත්වයට පත්වීමේ දී යුක්තියේ කාර්යභාරය කුමක් ද යන්නත් මෙමඟින් විශේෂයෙන් විමසා බැලෙනු ඇත.

මෙම අධ්‍යයනයේ කේන්ද්‍රීය කල්පිතය වන්නේ සමාජ - ආර්ථික තත්ත්වය හානියට පත් ජනයා පතන ආකාරයේ යුක්තිය කෙරෙහි සහ ඔවුන් එය සොයා යන අවස්ථාව කෙරෙහි බලපෑමක් සිදු කරන බවය.

ගැටුමින් විපතට පත් ජනතාව යථා තත්ත්වයට පත් කිරීමේ අංගයක් වශයෙන් කිසියම් ආකාරයක යුක්තියක් අවශ්‍ය වන්නේය යන උපකල්පනය මෙම කල්පිතය සමඟ දැඩි ලෙස බැඳී පවතින අතර, මෙම පර්යේෂණයේ දී එය විචාරාත්මක ආකාරයෙන් විමසුමට භාජන කරනු ලබන්නේය. උපකල්පනය වන්නේ 'යුක්තියෙන්' තොරව යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය අසම්පූර්ණ වූවක් වීමට ඉඩ තිබෙන අතර, සාමය ඇති කරලීමට ඇති හැකියාව සහ දිගුකාලීන සංහිඳියාව හා යථා තත්ත්වයට පත් කිරීම කෙරෙහි බලපාන්නා වූ බලවත් කලකිරීම සහ අපේක්ෂාභංගත්වය තිබූ ආකාරයෙන් ම රැඳී පවතින බවයි.

> *"ප්‍රචණ්ඩත්වය ඇති කරලීම හේතුවෙන් බිඳී විසුරුණු සමාජයන්ට මෙම භීෂණාත්මක ප්‍රචණ්ඩත්වයන්ට මුහුණ දීම පිණිස එකී අතීත අයථා සිදුවීම් සැලකිල්ලට ගනිමින් යාන්ත්‍රණයන් අනුගත කර ගැනීමට හෝ සැලසුම් කර ගැනීමට අවශ්‍ය වේ. එසේ නොවුනහොත්, අතීතය ජාතීන්ගේ සහ පුද්ගලයන්ගේ වර්තමානය සහ අනාගතය කෙරෙහි නොසිතූ ආකාරවලින් අහිතකර ලෙස බල පෑ හැක. ඉතා අශෝභන ප්‍රචණ්ඩත්වයන්හි ගොදුරු බවට පත්ව සිටි පුද්ගලයන් හෝ කණ්ඩායම් ඒවා හුදෙක් අමතක කර දමන්නේ යැයි හෝ ඔවුනට කිසියම් ආකාරයකින් යුක්තිය ඉටු වීමකින් තොර ව ඒ පිළිබඳ තම හැඟීම මුළුමනින් ම ඉවත ලනු ඇතැයි උපකල්පනය කිරීම දැඩි නොමනාපකම් සහ අනාගත ගැටුමක බීජ ඉතිරි කර තැබීමකි."*
> *(Kritz.N. 1997: p.2)*

මෙම අධ්‍යයනය මඟින් ගැටුමට ගොදුරු වූ අය අතුරින් මන්නාරමින් තෝරා ගන්නා ලද ප්‍රජා කණ්ඩායම් 3 කට අයත් ජනයා මෙම භීෂණාත්මක ප්‍රචණ්ඩත්වයේ භයානක තර්ජනයන්ට මුහුණ දුන්නේ කෙසේදැයි යන්න විමර්ශනය කරනු ලබන්නේ ය. අතීතය අනාගතය කෙරෙහි අනපේක්ෂිත ආකාරවලින් බලපෑමට ඉඩ ඇතැයි යන අදහස සහ එය යළිත් ඇති නොවීම සහතික කරගනු වස් බාහිර මැදිහත්වීමක හා ක්‍රියාමාර්ගයක ඇති අවශ්‍යතාව මෙම පත්‍රිකාව මඟින් විචාරාත්මක ලෙස විමසුමට බඳුන් කෙරෙන්නේය.

මෙම නිර්වචනයෙහි ගැබ් වන 'පීඩනයට ලක් වූවන්' බලගැන්වීමෙන් තොර කිරීම පිළිබඳ මතය සහ 'කිසියම් ආකරයක වගකිවයුතු බවක්' නොමැති වීමෙන් ගැටුම්වලට අදාළ අත්දැකීම් ගැන කටයුතු කිරීමට ක්‍රමයක් නැතැයි ද, එහි අනිවාර්ය ප්‍රතිඵලය වන්නේ දැඩි නොරිස්සුම්බවක් සහ අනාගතයේ ඇති වන ගැටුමකැයි යනුවෙන් හැඟවෙන මතය ද මෙම අධ්‍යයනය විසින් බැහැර කරනු ලැබේ. මෙම අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්ඡාවට භාජන කරන ලද සියලු ම ජනයා එල්.ටී.ටී.ඊ ය සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අතර සිදු වූ වෙඩි හුවමාරුවලට විවිධාකාරයෙන් මැදි වූ අය වන අතර, ඔව්හු දැනට තම අත්දැකීම්වලින් මිදී යථා තත්ත්යට පත් වෙමින් සිටිති. ස්වකීය ඉරණම උදාසීනත්වයෙන් යුතුව බාර නොගන්නා ආකාරයක් පළ කරන අය වශයෙන් සලකන කල ඔව්හු ගොදුරු බවට පත් වූවෝ නොවෙති. ඒ වෙනුවට ඔවුන් වෙතින් දක්නට තිබුණේ තමුනට සිදු වී ඇත්තේ කුමක් ද යන්න පිළිබඳ විධිමත් ආකාරයේ වගකිවයුතු බවක් හෝ තම ප්‍රජාවන්ගෙන් පරිබාහිරව කිසියම් ආකාරයක 'යුක්තියක්' දක්නට නොතිබුණ ද, යථා තත්ත්වයට පත්වීම පිළිබඳ ඔවුන් වෙතින් පළවූ ඉතා ක්‍රියාශීලී ක්‍රියාවලියකි.

### මන්නාරම තෝරා ගත්තේ මක්නිසාද?

අධ්‍යයනය සඳහා මන්නාරම තෝරා ගන්නා ලද්දේ ගැටුමෙන් ලද අත්දැකීම් සහ ඉන් අනතුරුව යථා තත්ත්වයට පත්වීම පිළිබඳ ගතිලක්ෂණ වලින් සහ විශේෂ අංගයන්ගෙන් එය සමන්විත වූ හෙයිනි. ශ්‍රී ලංකා රජය සහ දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය අතර ගැටුම්වලට හසුව තිබූ එම ප්‍රදේශයේ

ඇතැම් කොටස් රජයේ පාලනය යටතේ ද, තවත් කොටස් එල්.ටී.ටී.ඊ පාලනය යටතේ ද පැවැතියේ ය. ඒ හේතුවෙන් ගැටුම් පැවති ප්‍රදේශය දරුණු සටන් භූමියක් බවට පත් ව තිබිණ. බොහෝ සරණාගතයන් ඉන්දියාවට පළා යෑමට යොදා ගත් මෙම ප්‍රදේශය, ගැටුමින් හානියට පත් ප්‍රදේශවලට නිදහසේ යෑමඊමට ඉඩ සලසා දුන් අතර, ගැටුම්කාර දෙපක්ෂය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරු ව රට තුළ අවතැන් වූවන් සහ සරණාගතයන් ආපසු පැමිණ නැවත පදිංචි කරලීම සඳහා ද දායක විය. කරුණු මෙසේ වුව ද, හානියට පත් ඒ හා සමාන සෙසු ප්‍රදේශ සමඟ සසඳන කල, මන්නාරමෙහි සිදු වන පශ්චාත් ගැටුම් සංවර්ධනයෙහි සැලකිය යුතු මඟගාමී බවක් දක්නට ඇත. එයට අමතරව ගැටුමින් සිදු වී ඇති හානියට සහ යථා තත්ත්වයට පත්වීමට අදාළ කරුණු පිළිබඳ ව මන්නාරමෙහි සිදු කර ඇති පර්යේෂණ ද සීමිතය. මෙම පර්යේෂණය තීරණාත්මක කටයුතු සම්බන්ධයෙන් යොමු කිරීම සඳහා ප්‍රයෝජනයට ගත හැකි නව්‍ය සහ බෙහෙවින් ප්‍රයෝජනවත් තොරතුරු සපයා ගැනීමේ අරමුණින් සැලසුම් කරන ලද්දකි.

අධ්‍යයනයේ එල්ලය යොමු කෙරෙන ප්‍රජාවන් ගැටුම පැවති විවිධ මට්ටම්වල දී ඒ පිළිබඳ අත්දැකීම් ලබා සිටින අය වෙති. ඔවුන් තෝරා ගන්නා ලද්දේ ඔවුන් වෙතින් ඉදිරිපත් වන ජනවාර්ගික සහ ආගමික නියෝජනය සහ ඔවුන් ගැටුමින් හානියට පත් වී ඇති සාපේක්ෂක මට්ටම් සැලකිල්ලට ගැනීමෙනි.

අධ්‍යයනය සිදු කළ ස්ථානයන්හි ජනයා සමඟ පවත්වන ලද සාකච්ඡාවලදී ඉස්මතු වූ තොරතුරු, පර්යේෂණ ව්‍යාපෘතියේ ව්‍යුහය සංශෝධනය කිරීමට හේතු විය. ගවේෂණය කළ යුතු ඇතැම් අලුත් කරුණු ඉස්මතු වූ අතර, වෙනත් අදහස් අන්තර්ගත කිරීම අභියෝගයට ලක් කෙරිණ. අලුත් කරුණු අදාළ වන්නේ පශ්චාත් ගැටුම් අවස්ථාවන්හි මානව සුරක්ෂිතභාවය වැනි සංකල්ප සහ යුක්තිය, සාමය හා සන්ධානය පිළිබඳ අදහස් භාවිතයට යොදා ගැනීම පිළිබඳවය. මතු දක්වෙන කොටසින් මෙකී සංකල්ප හඳුන්වා දෙනු ලැබේ. ඇතැම් සංකල්ප මඟින් අධ්‍යයනයේ පසුබිම සැපයීම ද, තවත් ඒවායින් සම්මත අදහස් ලුහුඬින් දක්වීම ද සිදු කෙරෙන අතර, අධ්‍යයනය මඟින් මෙකල 'බලපවත්නා ඥානාන්විතභාවය' අභියෝගයට ලක් කෙරෙන්නේය.

## 2. සහසම්බන්ධතාව සකසා ගැනීම

### යුක්තිය පිළිබඳ නිර්වචනයන්

මෙම අධ්‍යයනය සඳහා භාවිතයට යොදා ගනු ලබන්නේ ක්‍රීස්බර්ග් විසින් පළ කරන ලද අදහස් මත පදනම් වූ යුක්තිය පිළිබඳ නිර්වචනයක් වන අතර ඔහු ඒ පිළිබඳව පළ කරන්නේ මෙවැනි අදහසකි.

> *"(මෙහිදී) යුක්තිය යනුවෙන් දක්වෙන්නේ බහුපැතිකඩවලින් යුත්, ඒවා පිළිබඳ කටයුතුවල නිරත ජනයා විසින් සාධාරණයැයි සලකනු ලබන සමාජ සම්බන්ධතා පිළිබඳ ක්‍රියාවලීන් සමූහයකි. යුක්තිය එකිනෙකට පරස්පර ගුණාංගයන්ගෙන් හා වෙනස් වන්නා වූ ප්‍රමිතිවලින් යුත් කිසි දිනක පූර්ණ වශයෙන් සපුරාගත නොහැක්කකි."*
> *(Kriesberg 2001 : p.47)*

මෙම නිර්වචනයේ මූලික අංගය වන්නේ යුක්තිය ක්‍රියාවලියක් පිළිබඳ අදහසක් ලෙස මිස ස්ථිතික සිද්ධියක් හෝ කාර්යසාධනයක් ලෙස දක්වා නොතිබීමයි. එය සම්මත සෙසු නිර්වචනයන්ට වඩා හාත්පසින් වෙනස් වන්නේ යුක්තිය ඒ කරා කිසි දිනක එළඹිය නොහැකි හෝ පූර්ණ වශයෙන් අත්පත් කරගත නොහැකි දෙයක් වශයෙන් තහවුරු කර දක්වා තිබීමේ හේතුව නිසාය. එය විවිධ මතවාද සහ සාරධර්ම මත පදනම් වූ ක්‍රියාවලියේ මාර්ගයෙන් සමාජය විපර්යාසයට භාජන කරන්නකි. එක් පිරිසකට ඉටු වන සාධාරණය, තවත් පිරිසකට අවශ්‍යයෙන් ම සාධාරණය ඉටු වීමක් නොවන බැව් සැලකිල්ලට භාජන කිරීමට ඉන් ඉඩ සැලසේ. යුක්තිය නිර්වචනය කළ හැකි බොහෝ විවිධ ආකාරයන්ට සහ යුක්තියට අදාළ එක ම ක්‍රියාවලිය තුළ විවිධ වූ බොහෝ මත පවතින්නට ඉඩ තිබීමට එහි දක්වෙන "එකිනෙකට පරස්පර ගුණාංග සහ වෙනස් වන්නා වූ ප්‍රමිතීන්" හේතු වී ඇත. විවිධ ඉල්ලීම්, අභිප්‍රේරණයන්, මතවාදයන් සහ හර පද්ධති යන මේ සියල්ල යොමු වී ඇත්තේ විවිධ හා බොහෝ දුරට එකිනෙකට පරස්පර ඉලක්කයන් කරා ය.

හානියට පත් පුද්ගලයන්ට එළඹිය හැකි විසඳුමක් වශයෙන් සහ තම අත්දැකීම්වලින් ඉදිරියට ගොස් ස්වකීය ජීවිත අඛණ්ඩ ව පවත්වා ගෙන යා හැකි තත්ත්වයක් වශයෙන් සලකන කල මෙම පර්යේෂණ ව්‍යාපෘතියට කේන්ද්‍රීය වූ කරුණ වන්නේ යුක්තියයි. එය අමූර්ත, පරිසමාප්ත ඉලක්කයක් වශයෙන් දකිනු නොලබන්නේ වී නමුදු යථා තත්වයට පත් කරලීමේ ක්‍රියාවලියෙහි නිරත ව සිටින ජනයා විසින් වඨිනය කරගත් දෙයක් ලෙස සැලකේ. එය ප්‍රජාවක් තුළ අත්හදා බැලීම සඳහා පර්යේෂකයන් විසින් ගෙන එන ලද විධානාත්මක අදහසක් හෝ සංවර්ධන ආධාර ලබාදීම සඳහා කොන්දේසියක් වශයෙන් ආධාර

සපයන්නන් විසින් ඉදිරිපත් කරන ලද්දක් ද නොවේ. මෙම පත්‍රිකාවට අනුව යුක්තිය යනු තමන් අතර ම සහ තමන් උදෙසා ම ප්‍රජාව විසින් අඛණ්ඩ ව වර්ධනය කරගෙන යමින් පවතින දෙයකි. පර්යේෂණයේ දී යුක්තිය පිළිබඳ ව සොයා බැලෙන්නේ අධ්‍යයනයට භාජන කරන ලද ප්‍රජාවන් අතර එම සංකල්පය පිළිබඳ තිබෙන අවබෝධය පදනම් කර ගෙනය. එය උසාවි, ප්‍රාදේශීය බලධාරීන් සහ පොලීසිය සම්බන්ධ වන්නා වූ විධිමත්, නෛතික, යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන්ට හා ව්‍යුහයන්ට අවශ්‍යයෙන් ම යොමු නොවන්නා වූ දෙයක් වුව ද, තම ගැටළුවලට, හරිවැරදිවලට සහ ගැටුමින් පැන නැගුණු කරුණුවලට ප්‍රජාව විසින් අනුගත කර ගනු ලැබූ විසඳුම් කෙරෙහි යොමු වන්නකි.

## සාමය පිළිබඳ නිර්වචනයන්

පර්යේෂණය සිදු කරන සමයෙහි දී උතුරේ සහ නැගෙනහිර පැවති යුද්ධය නොමැති / සාමය නොමැති තත්ත්වය තුළ මෙම අධ්‍යයනය සිදු කිරීමට අර්ධ වශයෙන් ඉවහල් වූයේ පර්යේෂකයන් හමුවේ පැවති අන්තරාදායක තත්ත්වය සාපේක්ෂක වශයෙන් අඩුවෙන් පැවතීමයි. මෙම සමයේ දී ප්‍රචණ්ඩත්වය නතර ව තිබීම නිසා අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රජා කණ්ඩායම් තුළ දක්නට ලැබුණු එහි බලපෑම කැපී පෙනෙන්නක් වූ අතර එය යුක්තිය සහ යථා තත්ත්වයට පත්වීම පිළිබඳ ඔවුන්ගේ සංජානනයන් කෙරෙහි බලපා තිබුණි. එසේ වුව ද, ගැටුම්වලට සම්බන්ධ පක්ෂ අතර දේශපාලන විසඳුමක් ඉදිරිපත් වීමක් හෝ පිළිගැනීමක් හෝ නොතිබීම සැලකිල්ලට ගැනීමට වටී. ඇතැම්විට සටන් විරාමය පවත්වා ගෙන යෑමට සිදුව ඇත්තේ විවෘත යුද්ධය නැවත ඇරඹීමෙන් දෙපක්ෂයට ම අහිමිවීමට යමක් තිබූ නිසාවෙන් හෝ එසේ නැතහොත් යුද්ධය පිළිබඳ හෝ වේවා, සාමය පිළිබඳ හෝ වේවා, නිශ්චිත ක්‍රියාමාර්ගයක් ගැනීමට දෙපක්ෂය තුළ ම දේශපාලනමය කැමැත්තක් මඳ වශයෙන් පැවතීම නිසා හෝ විය හැක. ගැටුම ප්‍රකට ආකාරයෙන් නොපැවතීම සාමය යනුවෙන් හඳුන්වා ලිය නොහැකි වුව ද, අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රජාවන්ට බෙහෙවින් සමීප ව පැවති කායික ප්‍රචණ්ඩත්වය තුරන් වී තිබීම වැදගත් කරුණක් විය. සුරක්ෂිතභාවය පිළිබඳ හැඟීමක් ඉන් ඔවුන් තුළ පහළ වූ අතර, ජනයා සහ භාණ්ඩ එහා මෙහා ප්‍රවාහනයට ඉන් ඉඩ සැලසුණි. සාමය පිළිබඳ සම්මත සංකල්පය අභියෝගයට ලක් කරන්නක් වූ නමුදු, එදිරිවාදිකම් එළිපිට නොපැවතීම, ප්‍රජාවන් සම්බන්ධයෙන් සලකන කල එය පිළිගත හැකි මට්ටමේ සාමයක් බැව් පෙනෙන්නට තිබුණි.

> *"සාමය යන්න පිළිබඳ ව පනවන ලද නියෝගයක පටන් එකඟතාව දක්වා වූ විවිධාකාර අර්ථ විශාල ප්‍රමාණයක් ඇත. ඉන් සෘජු කායික ප්‍රචණ්ඩත්වයක් නොපැවතීම හෝ කිසිදු කණ්ඩායමක් ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයක අත්දැකීමක් ලබා නොතිබීම හැඟවීමට ඉඩ තිබෙන අතර පළමු තත්ත්වය බොහෝ විට සෘණාත්මක සාමය වශයෙන් ද, දෙවැන්න ධනාත්මක සාමය යනුවෙන් ද හැඳින්වේ. අනතුරු ව, සෘණාත්මක සාමය යන්නෙන් යුද්ධය නොපැවතීම අදහස් වේ. එය සාමය හා සුරක්ෂිතභාවය හඟවන්නක් විය හැකි වුව ද, ඉන් අයුක්තිය ප්‍රතිසාධනය කිරීම සඳහා කරන අරගලයන් මැඩපැවැත්වීම ද හැඟවීමට ඉඩ ඇත. ධනාත්මක සාමය යනුවෙන් දක්වෙන්නේ එකම සමාජ පද්ධතියක් තුළ වසන ජනයාගේ ජීවිතවල තත්ත්වයන් යටත් පිරිසෙයින් සාධාරණත්වය පිළිබඳ අවම මට්ටමක පැවතීමය."*
> *(Galtung 1996, p.48)*

(දිවයිනේ සෙසු පළාත්වල මෙන්) මන්නාරමෙහි ද බිඳෙනසුළු සෘණාත්මක සාමයක් පැවති හෙයින් මෙම අධ්‍යයනය එහි දී සිදු කරන ලදී. 2002 දී සටන් විරාම ගිවිසුම ක්‍රියාවට නැංවුන හෙයින් ගැටුමේ පැවති තීව්‍රතාව වෙනසට භාජන විය. ගිවිසුම කඩවීමේ සිද්ධි දෙපක්ෂයෙන් ම නිරතුරු ව වාර්තා වූ නමුදු, අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රජාව අතර පැවති හැඟීම වූයේ නියත අවසානයක් දැකිය හැකි අවස්ථාවක් කරා ගැටුම මන්දගාමී ව ළං වෙමින් තිබෙන බව ය. මින් හැඟවෙන්නේ කල් පවත්නා සාමයක් අනිවාර්ය බැව් ඔවුන් උපකල්පනය කළ බව නොවේ. ඔවුන් වෙතින් පළ වූයේ අවසානයේ දී ඇති වන සාමයක් පිළිබඳ ව වඩාත් බලාපොරොත්තු තැබිය හැකි හැඟීමක් ඔවුන් තුළ පහළ ව තිබෙන බවකි. සාමය කරා යන ගමන තවමත් හෙමිහිට සිදුවෙමින් පවතින්නක් වන අතර, සටන් විරාමයෙන් පසු වසරවල දී සිදු වූ සමාජ - ආර්ථික වර්ධනයන් මඟින් දක්වා ඇත්තේ පෙර පැවති කිසිදු කාලසීමාවකට වඩා මෙම කාලසීමාව තුළ එය සිදු කිරීම පහසු වී ඇති බවය.

මෙම අධ්‍යයනය සිදු කරන ලද්දේ සෘණාත්මක සාමයේ සිට ධනාත්මක සාමය දක්වා සංක්‍රාන්ත වෙමින් පවතින කාලසීමාව තුළය. සිත්ගන්නාසුළු කරුණ වන්නේ සෘණාත්මක සාමය කෙතරම් දුරට කල් පවතී යැයි පෙනෙන්නේ ද යන්නත්, ව්‍යුහාත්මක වෙනසකින් තොරව හා වැඩි වෙමින් පවතින අසමානාත්මක බව මධ්‍යයේ ජනයා තම ජීවිත අඛණ්ඩ ව ගොඩ නගනු ලබන්නේ ද යන්නත් ය. මෙම සංක්‍රාන්තය අවශ්‍ය වූවකැයි සහ අපේක්ෂිත අවසානය විය යුත්තේ ධනාත්මක සාමයැයි යන පූර්වනිගමිත මතයන් මෙම

පර්යේෂණය මගින් අභියෝගයට ලක් කෙරේ. ඒ මගින් විවිධ ආකාරයන්හි සාමයෙහි ගැබ් වන යහපත් ගුණාංග ගැන ප්‍රශ්න නැගීමක් හෝ විවාද කිරීමක් නොකරන නමුදු, අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රජාවන් සම්බන්ධයෙන් සලකන කල, සෘණාත්මක සාමය ඇති කරලීම ගැටුමින් යථා තත්වයට පත් කරලීම පිළිබඳ ක්‍රියාවලියේ ආරම්භයන් සඳහා ප්‍රමාණවත් බැව් පෙනෙන්නට ඇත්තේ කෙසේදැයි අනාවරණය කෙරේ. ඉන් තවදුරටත් හුවා දක්වෙන්නේ ධනාත්මක සාමය සඳහා අවශ්‍ය අවම ප්‍රමාණයේ සාධාරණත්වය දක්නට නොමැති බවයි.

මෙම පර්යේෂණය සිදු කරන ලද්දේ ගැටුමින් හානියට පත් දිස්ත්‍රික්කයක්, ප්‍රදේශයක් හෝ රටක් තුළ වසන, එසේ ම ගැටුමින් විවිධ මට්ටමින් හානියට පත් ප්‍රජාවන් අතරය. ගැටුම පැන නැගීමට හේතු වී ඇත. රටේ ජීවන තත්වයන් එක සමාන මට්ටමට සාධාරණ නොවූ බවට ඇති වූ සංජානනය. සාධාරණය පිළිබඳ එම මට්ටමට ළඟා වීමට නම් අතිවිශාල සමාජ පරිවර්තනයක් සිදු විය යුතුය. මෙය එබඳු පරිවර්තනයක් අවශ්‍යය යන්න පිළිබඳ විවාද කිරීමක් නොවන නමුදු, එය විශාල අභියෝගයක් බව ඉදිරිපත් කරන අතර, ගැටුමින් යථා තත්ත්වයට පත් වීම පිළිබඳ වත්මන් අවස්ථාව සම්බන්ධයෙන් සලකන කල, එම තත්ත්වය තවමත් දුරස්ත ඉලක්කයකි. යථා තත්වයට පත්වීම මෙම ආකාරයේ සමාජ සංක්‍රාන්තියක් මත රැඳී පවතින්නක් දැයි යන්න ද මෙම පර්යේෂණයෙන් ප්‍රශ්න කෙරේ.

**මානව සුරක්ෂිතභාවය**

ප්‍රචණ්ඩකාරී ගැටුම ප්‍රකට ව නොපැවතීම අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රජාවන් තුළ සුරක්ෂිතභාවය පිළිබඳ හැඟිමක් ජනිත කර තිබේ. මහා පරිමාණයෙන් පැවති සන්නද්ධ ප්‍රචණ්ඩත්වය නතර වීමෙන් මෙම ආකාරයට ගැටුම සෘජු ආකාරයෙන් අත් විඳින ලද ප්‍රජාවන් තුළ සුරක්ෂිතභාවය පිළිබඳ හැඟීමක් පහළ වූ බව ඇදහීම අභියෝගාත්මක කරුණකි. මේ නිසා සුරක්ෂිතභාවය යන පදය සහ ඒ ඇසුරින් හැඟවෙන දේ ප්‍රතිශෝධනය කිරීම අවශ්‍ය කෙරේ. ගැටුමින් සහ සංවර්ධනය පිළිබඳ සංකථනය (discource) තුළින් ඉස්මතු වන මානව සුරක්ෂිතභාවය පිළිබඳ සංකල්පය මෙම පර්යේෂණය මගින් අභියෝගයට ලක් කරනු ලැබේ. සුරක්ෂිතභාවයෙන් තොර පරිසරයක තිබිය යුතුයැයි සැලකිය හැකි සියලුම අංගවලින් සමන්විත වූ එය අංග සම්පූර්ණ දෙයක් ලෙස පෙනී යන්නේ යැයි දක්වෙන උපකල්පනය ඇතුළු සුරක්ෂිතභාවයේ පරමාදර්ශ අවස්ථාවට අදාළ විවිධ අංශ මෙම පර්යේෂණයේ දී ප්‍රශ්න නැගීමට භාජන කෙරේ. සුරක්ෂිතභාවය පිළිබඳ එබඳු තාවකාලික හැඟීමක් යථා තත්වයට පත් කරලීමේ ක්‍රියාවලියක් ඇරඹීම පිණිස ජනයා ප්‍රමාණවත් වන්නේ කෙසේදැයි යන්න මෙම පර්යේෂණයේ දී අනාවරණය වන්නේය. මානව සුරක්ෂිතභාවය වැනි නව සංකල්ප වර්ධනය කිරීමේ අවශ්‍යතාව ගැන ප්‍රශ්නයක් මතු කරන අතර ම, සංවර්ධන සංකථනය ඇතැම් අවස්ථාවල දී එබඳු සංකල්ප ගැන එතරම් උනන්දුවක් දක්වන්නේ මන්ද යන්න ගැනත්, ගැටුමින් යථා තත්වයට පත් වීම වැනි සංකල්ප දෙස එබඳු දෘෂ්ටිකෝණයකින් බැලීම අවශ්‍ය වන්නේ මක්නිසාද යන්න ගැනත් පර්යේෂණය ප්‍රශ්න නගයි.

> *"මානව සුරක්ෂිතභාවය යනු ක්‍රියාව, භීතියට හෝ පීඩනයට පත් නොවීමෙන් ලබන නිදහස, මානව අයිතිවාසිකම් ආරක්ෂා වීම, භුක්ති විඳීම සහ මානව අභිමානය සුරැකීම යන කරුණුවලින් සැදුම්ලත් ආරක්ෂාව පිළිබඳ පිළිගත් ආකාරයකි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ 1994 වසරේ මානව සංවර්ධනය පිළිබඳ වාර්තාවේ මානව සුරක්ෂිතභාවය අර්ථකථනය කර ඇත්තේ මූලික අංක දෙකකින් සමන්විත වූවක් ලෙසිනි. පළමුව, කුසගින්න, රෝගාබාධ සහ මර්දනය ආදිය ඇතුළත් 'බොහෝ කල් පවත්නා' තර්ජනයන්ගෙන් ලබන ආරක්ෂාව ද, දෙවනුව, දෛනික ජීවන රටාවේ සිදුවන වේදනා ඇති කරන හදිසි බාධාවන්ගෙන් ලබන ආරක්ෂාව ද වේ.*
> *(UNDP, 1994, p.23)*

> *"මානව සුරක්ෂිතභාවයට අයත් අංග අතරට ආර්ථිකය, ආහාර, සෞඛ්‍යය, පරිසරය යන කරුණු සහ පෞද්ගලික, ප්‍රජා හා දේශපාලන ආරක්ෂාව ද ගැනෙන අතර ඒවා අතර අන්‍යොන්‍ය වශයෙන් පවත්නා අන්තර්සම්බන්ධතාව ද ඊට ඇතුළත් වේ. මෙම අංග අතුරින් එකක් හෝ ප්‍රතික්ෂේප වීමෙන් සෙසු ඒවාට ද බාධා පැමිණෙන්නේය."*
> *(Thomson - Senanayake 2002" p.10)*

මින් හැඟවෙන්නේ මානව අයිතිවාසිකම් පිළිබඳ සංකථනය ගැටුමින් යථා තත්වයට පත් වීමෙහි ලා එක් අවශ්‍යතාවක් වන බවය.

*"සංක්‍රාන්ත යුක්තිය පිළිබඳ සහසම්බන්ධතාවෙහි ලා සලකන කල සන්ධානය සහ සක්‍රීය ප්‍රජාතාන්ත්‍රික සමාජයක් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා සියලු අංශවල මානව සුරක්ෂිතභාවය පුනස්ථාපනය කිරීම අවශ්‍ය කෙරේ. අධිකතර අභ්‍යන්තරික ගැටුම හෝ මර්ධනය පිළිබඳ කාලපරිච්ඡේදයන්ගෙන් විමුක්ත වීමට උත්සාහ දරන සමාජයන්හි දේශපාලන, පෞද්ගලික සහ ප්‍රජා සුරක්ෂිතභාවයන් වැනි මානව සුරක්ෂිතභාවයට අයත් විවිධ අංග වඩාත් තීව්‍ර කරන ලද වැදගත්භාවයකට පත් වේ. එතකුදු වුවත්, කෙනෙකුට ලෝකයේ හිමි තැන පුනස්ථාපනය කිරීමට ඔහුගේ දෛනික මානව අවශ්‍යතාවන් සහතික කෙරෙන ආර්ථික, ආහාර සහ සෞඛ්‍ය සුරක්ෂිතභාවය ද සපිරී තිබිය යුතු වේ."*
*(Thomson - Senanayake " 2002( p10)*

මෙම අදහස පර්යේෂණයේ අභියෝගයට ලක් වන්නකි. "මානව සුරක්ෂිතභාවයේ සියලු ම අංග" පුනස්ථාපනය කිරීමට අවශ්‍ය යැයි කෙරෙන පැනවීම ද අභියෝගයට භාජන වන්නේය. ගැටුමින් හානියට පත් ජනයාගේ නියම අවධානයට ලක් වන දේ සහ අපේක්ෂාවන් අනාවරණය කරන එයට සන්ධානගත වීම හෝ සක්‍රීය ප්‍රජාතාන්ත්‍රික සමාජයක් ප්‍රතිෂ්ඨාපනය කිරීම අවශ්‍යයෙන් ම ඇතුළත් වන්නේ නැත. පර්යේෂණයෙන් අනාවරණය කරන දෙය වන්නේ සන්ධානගත වීම ප්‍රජාව සම්බන්ධයෙන් සලකන කල දුරස්ථ සිදුවීමක් වන අතර, සක්‍රීය ප්‍රජාතාන්ත්‍රික සමාජය ප්‍රතිෂ්ඨාපනය කිරීම හුදෙක් සැලකිල්ලට ගත යුත්තක් නොවන බවය. එබැවින් පර්යේෂණයේ අනාවරණයන් මඟින් එබඳු සංකල්පවල අදාළභාවය අභියෝගයට ලක් කෙරෙන අතර ම ඒවා පශ්චාත් ගැටුම් සංවර්ධන සංකථනයන්ට අනුකලනය කිරීමෙන් කෘත්‍රිම අපේක්ෂාවන් ජනිත කරන්නේ සහ කෘත්‍රිම අවශ්‍යතාවන් පළ කරන්නේ කෙසේදැයි යන්න ද අනාවරණය කරයි. යථා තත්වයට පත්වීමේ ක්‍රියාවලියේ දී තම ජීවිත ඇරඹීමට සහ ඒවා පවත්වා ගෙන යෑමට ජනයාට ඇත්ත වශයෙන් ම අවශ්‍ය ව ඇති ස්වල්පය මඟින් අවශ්‍ය දේ කුමක් ද යන්න පිළිබඳ සාවද්‍ය මත චිරස්ථායි බවට පමුණුවන යථා තත්වයට පත්වීම පිළිබඳ වත්මනේ ප්‍රචලිත ප්‍රබල සංකල්ප අභියෝගයට ලක් කෙරේ.

**සන්ධානගතවීම පිළිබඳ නිර්වචනයන්**

මානව සුරක්ෂිතභාවය පිළිබඳ සංකල්පයේ අදාළභාවය අභියෝගයට ලක් කිරීමේ දී, 'සන්ධානගතවීම' පිළිබඳ සංකල්පය ගැන තිබෙන වෙනස් ආකාරයේ අවබෝධයක් ද පර්යේෂණය මඟින් හුවා දැක්වේ. සන්ධානගතවීම විධිමත් ලෙස නිර්වචනය කර ඇත්තේ මෙලෙසිනි :

*"සන්ධානගතවීම යන්නට අතීතය පිළිබඳ අවධානයන් සහ එම අවධානයන් අනාගතය පිළිබඳ අවධානයන්ට හා අපේක්ෂාවන්ට අවියෝජනීය ලෙස සම්බන්ධව තිබෙන බව පිළිගැනීම දක්වන සංක්‍රාන්ත යුක්තිය පිළිබඳ ක්‍රියාවලියේ එක් මොහොතක් ඇතුලත්ය."*
*(Thomson - Senanayake 2002 : p. 11)*

පර්යේෂණයෙන් අනාවරණ වන්නේ මෙම 'මොහොත' දීර්ඝ එකක් විය හැකි බවය. යුක්තිය මෙන් ම සන්ධානගතවීම ද එක දවසකින් සපුරා ගත හැකි දෙයක් නොව, එය අත්කර ගැනීම සඳහා උත්සාහ දැරිය යුතු දෙයකි. එම පරමාදර්ශය කරා ළඟා වීම සඳහා උත්සාහ දැරීමේ ක්‍රියාවලිය ද සමාජයේ මහත් විපර්යාසයක් ඇති කරලීමට බලපාන්නකි.

මෙම නිර්වචනය සන්ධානගත වීමේ 'මොහොතෙහි' ලුහුඬින් දක්වා ඇති සිද්ධිවලට අදාළ එක්තරා ප්‍රගමනයක් දක්වන්නකි. අධ්‍යයනයේ දී සොයා ගත් දේවලින් දක්වෙන්නේ මෙම ප්‍රගමනය සෑම වෙලේ ම සිදු නොවන්නක් බවත් අතීතයේ දී අවධානයට ලක් වූ දේ පිළිබඳ ව දිගින් දිගට ම සිදු වන හඳුනා ගැනීමක් තිබෙන බවත්, එම අවධානයට ලක් වූ දේවල් අනාගතය මත රැඳී පවතින බවට ප්‍රත්‍යක්ෂයක් තිබෙන බවත් ය. කෙසේ වුව ද, වත්මන් පර්යේෂණයෙන් අනාවරණය වන්නේ මෙම ප්‍රත්‍යක්ෂයෙන් වැඩි කොටසක් ඇති වන්නේ සන්ධානගත වීම එක සේ සිදුවිය යුතු ව තිබෙන වඩාත් පුළුල් ජාතික මට්ටමෙන් දුරස් වූ ප්‍රජා මට්ටමේ දි බවය. ජාතික මට්ටමේ දී මෙම අවධානයන් හසුරුවනු ලබන්නේ අභිලාෂිත දේශපාලන පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා වන අතර, බොහෝ විට එහි ප්‍රතිඵලය වන්නේ සන්ධානගත වීමෙන් බැහැරව යළි ඇරඹුණු හෝ දිග් ගැස්සුණු ගැටුමක් කරා ඇදී යාමය.

දැඩි මර්ධනයට හෝ ගැටුමට භාජන කරන ලද සමාජයන්හි සන්ධානගතවීම රැඳී පවතින්නේ කායික සුරක්ෂිතභාවය සහ වැඩිදුර ප්‍රචණ්ඩත්වය පැවතීම පිළිබඳ තර්ජනයන්ට අදාළ පිළිගත් අවසානයක් ඇතුළු කරුණු මතය.

*"ගෝචර බවට පත් වූ ප්‍රජාවගේ ව්‍යුහාත්මක අසමානතාවන් සහ මූලික භෞතික අවශ්‍යතාවන් කෙරෙහි අවධානය දක්වීම ද, මුලින් විරුද්ධවාදී ලෙස පැවති පක්ෂ එකමුතු කිරිමේ ස්වාභාවික සම්බන්ධතාවන් සමාජය තුළ පැවතීම හෝ ඉතාමත් සරල ව කිවහොත් (බොහෝවිට නොතකා හරින) කාලාතික්‍රමණය (හෙවත් කල් ගතවීම) ද අවශ්‍ය විය හැක."*
*(Hayner 2002, p.6)*

ඒ සඳහා සරල වූ කාලාතික්‍රමණය යථා තත්වයට පත්වීම කෙරෙහි බලපාන්නක් වශයෙන් සහ හානියට පත් ප්‍රජාවන් අතර සන්ධානගතවීම සඳහා වේදිකාව සකසන්නක් ලෙස වැදගත් සාධකයක් වන බැව් පර්යේෂණයේ දී ඉස්මතු වූ කරුණක් විය. ඔවුන් කාලය පිළිබඳ ව කතා කරන ආකාරයෙන් හෙළි වන්නේ ඇතැම්විට එය එතරම් ම සරල වූවක් නොවන බවය. ගැටුම නතරවීමෙන් අනතුරුව ඔවුන් ගත කරන කාලය, තම ජීවිකාවන් යළි ගොඩ නැගීම ඇරඹීමට ඔවුන් ගත කරන කාලය සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ව්‍යාප්ත වන තර්ජනයෙන් මිදී ජීවිතය ගත කරන කාලය යන දේ ඔවුන් යථා තත්වයට පත්වීම පිළිබඳ ක්‍රියාවලියේ අමිල වූ කොටසක් විය. මෙම කාලය තුළ ශාරීරික සුරක්ෂිතභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම, අවිනිශ්චිත සටන් විරාමය මඟින් තවදුරටත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ තර්ජනය පැන නොනගින බවට ඇති පිළිගැනීම සහ ප්‍රජා සංවිධාන හා ආයතන පැවතීම සහ ඒවා තවදුරටත් වර්ධනය කිරීම යන මේ සියල්ල යථා තත්වයට පත්වීමේ සහ සන්ධානගතවීමේ ක්‍රියාවලියට වැදගත් දායකත්වයක් සපයන සාධක වේ.

## නිගමනය

පර්යේෂණයේ මෙම කොටසින් අදහස් කෙරෙන්නේ පශ්චාත් ගැටුම් සමයේ යුක්තිය සහ යථා තත්වයට පත් වීම වත්මන් විවාදයන්හි සීමාව ඇතුළත ස්ථානගත කිරීමටත්, පැන නගින්නා වූ ඇතැම් ගැටළු මෙම පත්‍රිකාව අවසානයේ දී පසුව වඩාත් විස්තර සහිතව හඳුන්වා දීමටත් ය. මෙම පත්‍රිකාව මුලුල්ලේ ම යුක්තිය පිළිබඳ නිර්වචනය බහුල වශයෙන් භාවිත කර ඇත්තේ ක්‍රියාවලියක් ලෙස මිස ශාක්ෂාත් කරගත හැකි අවසානයක් ලෙස නොවේ. ආශ්‍රිත ස්ථාවර අර්ථයන් සහ අදහස් මාලාවක් සහිත දැඩි සංකල්පයක් වෙනුවට ඉන් ඉදිරිපත් කෙරෙන්නේ වඩාත් නම්‍යශීලී හා මඳ විධානාත්මක ආකාරයෙන් ඒ දෙස බැලීමකි. මෙම පත්‍රිකාවෙහි භාවිත කර ඇති සාමය පිළිබඳ නිර්වචනයෙන් හුවා දැක්වෙන්නේ ව්‍යාපෘතිය සිදු කරනු ලබන්නේ අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රජාවන් බිඳෙනසුලු සෘණාත්මක සාමයක සිට ප්‍රබල ධනාත්මක සාමයක් කරා යොමු වෙමින් සිටින සමයක දීය යන කරුණුය. සෘණාත්මක සාමය පිළිබඳ මෙම කාලසීමාවේ වැදගත්කමත්, එය ගැටුමින් මිදී යථා තත්වයට පත් වීමට දායක වන්නේ කෙසේද යන්නත් මෙම පර්යේෂණයෙන් වෙසෙසින් දක්වේ.

ගැටුම් සමයෙන් අනතුරුව යථා තත්වයට පත්වීම පිළිබඳ කාර්යයන්හි දී මානව සුරක්ෂිතභාවය වඩාත් වැදගත් හා බලගතු සංකල්පයක් බවට පත් වෙමින් තිබේ. එසේ වුව ද, එම සංකල්ප අංග බොහොමයක ගැබ් වන ඊට ආවේණික දුර්වලතා ද පර්යේෂණය මඟින් හුවා දක්වා ඇත. 'යුක්තිය' සහ 'සන්ධානගතවීම' පිළිබඳ ව මෙන් නොව, 'මානව සුරක්ෂිතභාවය' දෙස බැලිය යුත්තේ එය ම අවසානය වශයෙන් සලකා නොව, සමාජ විපර්යාසයේ මන්දගාමී ක්‍රියාවක් වශයෙන් සැලකීමෙනි. මෙම පර්යේෂණයෙහි ලා 'කාලාතික්‍රමණය' යන්නෙහි වැදගත්කම විදහා දක්වන අතර මෙම පත්‍රිකාවෙහි කේන්ද්‍රීය තේමාව වන්නේ ද එයයි.

## 3. අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රජාවන්

අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රජාවන් තෝරා ගන්නා ලද්දේ ඔවුන් වෙතින් දිස්ත්‍රික්කය තුළ පවතින ජනවාර්ගික සහ ආගමික සංයුතිය නියෝජනය වී තිබූ නිසාත්, ඔවුන් ගැටුම විවිධාකාරයෙන් අත්විඳ තිබූ නිසාත් සහ යථා තත්වයට පත් වීමේ ක්‍රියාවලියේ විවිධ අවස්ථාවන්හි පසු වෙමින් සිටි නිසාත් ය. ජනවිකාශ විද්‍යාවට සහ ගැටුමට අදාළ සාධකවලට අමතරව එකී ප්‍රජාවන් වෙතින් විවිධ සමාජ - ආර්ථික ගතිලක්ෂණ ද විදහා දක්වුණි.

*KRI*[1] *(ක්‍රි)*

'ක්‍රි' යනු මන්නාරම නගරයට පහසුවෙන් ළඟා විය හැකි අර්ධ නාගරික ප්‍රදේශයකි. එහි වාසය කරන්නේ වැඩි වශයෙන් ම 'මධ්‍යම පන්තික' ප්‍රජාවකි. එහි ජනවාර්ගික සංයුතිය බහුල වශයෙන් ද්‍රවිඩ වන අතර එම ප්‍රජාවගේ ප්‍රධාන ආගම වන්නේ හින්දු දහමයි. ප්‍රජාව අතුරින් 90% තරම් ම උතුරු සහ නැගෙනහිර පළාත්වලින් පැමිණි අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන්ය. ඔවුන් මෙම ප්‍රදේශයේ නැවත පදිංචි කරවා ඇති අතර, වසර බොහෝ ගණනක සිට ඔව්හු එහි වාසය කරති.

*MSL*

මන්නාරමේ එල්.ටී.ටී.ඊ පාලන ප්‍රදේශය තුළ වෙසෙන ග්‍රාමීය ප්‍රජාවකි. මෙම ප්‍රජාව කරා පහසුවෙන් ළඟා විය නොහැක්කේ මාර්ගවල අසතුටුදායක තත්වයන්, මහජන ප්‍රවාහන සේවාවක් නොමැතිවීම සහ පවත්නා ප්‍රධාන මාර්ගවලට සම්බන්ධ නොවීම නිසා හුදකලා වීම යන කරුණු හේතුවෙනි. ජනවාර්ගික සංයුතිය මුස්ලිම් වන අතර ප්‍රධාන ආගම වන්නේ ඉස්ලාම් දහමය. ගම් තුනෙහි වසන පවුල් අතුරින් 70% මැතක දී එහි පදිංචි වූවන් වන අතර ඔවුන් එහි පදිංචියට පැමිණ ඇත්තේ අධ්‍යයනය සිදු කිරීමට මාස කිහිපයකට පෙරය. එසේ පෙරළා පැමිණි අය අතුරින් ඇතැම් අය සතු පාරම්පරික ඉඩකඩම් එම ප්‍රදේශයේ තිබිණ. සෙසු ජනයා එම ප්‍රජාවට සම්බන්ධව සිටියේ විවාහ සහ වෙනත් සමාජ සම්බන්ධතා හේතුවෙනි. ප්‍රදේශය ආර්ථික තත්වය අතින් බෙහෙවින් පහත් මට්ටමේ පැවති අතර, නැවත පදිංචි වන පවුල් සඳහා වූ යටිතල පහසුකම් වූයේ ද ඉතා අල්පයකි. ඔවුන් ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික ප්‍රජාවක් වුව ද, වාරිමාර්ග පද්ධති සහ ජීවනෝපායට අදාළ අනෙකුත් යටිතල පහසුකම් ගැටුම හේතුවෙන් බෙහෙවින් හානියට පත් ව තිබිණ. ඔවුන්ට ලැබෙන බාහිර උපකාර ද ඉතා අල්පය.

*NNT*

NNT යනු මන්නාරම නගරයට තරමක් දුරින් පිහිටි නමුදු, සිටින්නේ ප්‍රධාන මාර්ගවලට පිවිසීමේ පහසුකම් සහිත ව පසු වන අර්ධ නාගරික ප්‍රජාවකි. එය බහුල වශයෙන් සිටින්නේ ද්‍රවිඩ, රෝමානු කතෝලික ප්‍රජාවකි. 1990 - 1993 අතර කාලයේ දී මෙම ප්‍රජාව අතුරින් ඇතැමෙක් මන්නාරම් දිස්ත්‍රික්කයේ මඩු ප්‍රදේශයටත්, දකුණු ඉන්දියාවටත් අවතැන් වූහ. ඔවුන් 1994 න් පසුව ආපසු පැමිණ ඇත. ඔවුහු ගැටුම පැවති කාලයේ දී අවතැන් වී සිටි නමුදු, පර්යේෂණය සිදු කිරීමට වසර 10 කට පෙරාතුව යළි පදිංචියට පැමිණ සිටියහ. ප්‍රධාන ජීවනෝපායී මාර්ගයන් වන්නේ ගොවිතැන සහ සුළු ව්‍යාපාරයන්ය.

## 4. ක්‍රමවේදය

අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලද්දේ අරමුණක් පාදක වූ නියැදියකි. නියැදි ප්‍රජාවන් තෝරා ගනු ලැබුවේ මන්නාරම ප්‍රදේශයේ පිහිටි සංවිධානයක සහායෙනි. අධ්‍යයනයෙන් ගවේෂණය කිරීමට නියමිත තේමාවන්හි සංවේදීභාවය හේතුවෙන් ඒ පිළිබඳ මූලික හැඳින්වීමක් ජනයා දන සිටි සහ ඔවුන්ගේ විශ්වාසය දිනා සිටි එම ප්‍රදේශයේ සංවිධානයක නියෝජිතයන් මාර්ගයෙන් ලබා දීම අවශ්‍ය විය. දිස්ත්‍රික්කයේ ජනවාර්ගික අනුපාතයට සරිලන සේ ඔවුන් නියෝජනය කිරීම සඳහා ද්‍රවිඩ ප්‍රජා කණ්ඩායම් දෙකක් සහ එක් මුස්ලිම් කණ්ඩායමක් තෝරා ගන්නා ලදී. අවතැන්වීම සහ යළි පදිංචියට පැමිණීම යන කරුණු මත, ගැටුමින් විවිධ මට්ටමින් පීඩාවට පත් වූවන් අධ්‍යයනය සඳහා යොමු කර ගන්නා ලදී. අධ්‍යයනය සඳහා දායක වූ එක් ප්‍රජා කණ්ඩායමක් එම ප්‍රදේශයට පෙරලා පැමිණ තිබුණේ අධ්‍යයනය සිදු කිරීමට මාස කිහිපයකට පෙරය. තවත් ප්‍රජා කණ්ඩායමක් අවතැන් වීමට භාජන වී තිබුණ ද ඔවුන් යළි පැමිණ පදිංචි ව තිබුණේ අධ්‍යයනය සිදු කිරීමට වසර 10 කට පෙරය. මන්නාරමට නුදුරින් පදිංචි ව සිටි අනෙක් ප්‍රජා කණ්ඩායම අවතැන් වීමට සැලකිය යුතු අන්දමින් ලක් ව සිටියේ නැත.

---

1. ප්‍රතිචාර දක්වූ අයගේ නිර්නාමිකත්වය සුරැකෙන පරිදි මෙම පත්‍රිකාවෙහි ප්‍රජාවන්ගේ නම් සඳහන් නොකෙරේ.

ප්‍රජාවන් අතුරින් ගෘහවාසයන් තෝරා ගන්නා ලද්දේ ප්‍රාදේශීය සංවිධානයේ නියෝජිතයන් කළ පෙන්වා දීම් සහ භෞතික වත්කම් පදනම් කර ගනිමින් සමාජ - ආර්ථික තත්ත්වයන් පිළිබඳ වෙනස්කම් උපරිම ආකාරයට හසු කරගත හැකි වන පරිදිය. සම්මුඛ සාකච්ඡාව මඟින් මුලදී ම මෙහි වලංගුභාවය තහවුරු කර ගන්නා ලදී. ඉහළ, මධ්‍යම සහ පහළ සමාජ - ආර්ථික තත්ත්වයන් යනුවෙන් පසු ව වර්ග කර දක්වීම් සිදු කරන ලද්දේ ද, මෙම තොරතුරු සහ තම ප්‍රජාව සමඟ සැසඳීමේ දී ස්වකීය ගෘහවාසය පිළිබඳ ව කරන ලද තක්සේරුව මතය. මෙම ප්‍රජාවන්ගෙන් තොරතුරු එක්රැස් කර ගන්නා ලද්දේ අධ්‍යයන කණ්ඩායම විසින් වර්ධනය කරන ලද ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ආකෘතියක් භාවිතයට යොදා ගැනීමෙනි. දත්ත දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය තුළ ම සසඳා බලා, විශ්ලේෂණය කරන ලදී. එහි ප්‍රතිඵලය වන කාර්ය පත්‍රිකාව එහි අවසන් මුද්‍රණයට පෙර කාර්ය මණ්ඩලයේ නිරත සමානයන්ගේ විමසුමට යොමු කරනු ලැබීය.

පුද්ගලයන්ගේ සහ ප්‍රජාවන්ගේ අනන්‍යතාව හෙළි නොකිරීමේ ප්‍රතිපත්තියක් මෙම අධ්‍යයනයේ දී අනුගමනය කරන ලදී. සම්මුඛ සාකච්ඡාවලින් උපුටා ගත් උද්ධෘතයන් ප්‍රතිචාරකයන්ගේ ස්ත්‍රීපුරුෂභාවය, වයස සහ ප්‍රජාව යන කරුණු සමඟ ඉදිරිපත් කෙරිණ. අධ්‍යයනය සංවේදී තොරතුරු මත පදනම් ව ඇති හෙයින්, මෙසේ කරන ලද්දේ අධ්‍යයනයට සහභාගී වූ ප්‍රජාවන්ට කිසියම් අහිතකර ප්‍රතිවිපාකයක් ඇති වීම වළකා ලනු පිණිසය.

## 5. ගැටුමට අදාළ අත්දැකීම්

ගැටුම එක් එක් ප්‍රජාවට සහ එක් එක් ගෘහවාසයට බලපා ඇත්තේ එකිනෙකට වෙනස් ආකාරයටය. ජනවාර්ගික සංයුතිය, ස්ථානයේ පිහිටීම සහ සමාජ - ආර්ථික තත්ත්වය පිළිබඳ වෙනස්කම් දක්නට තිබුණ ද අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රජාවන්ට මුහුණ පෑමට සිදු වූ ගැටුමට අදාළ අත්දැකීම්වල සමානතාවයන් සිත් කාවදිනසුලු විය. මෙම කොටසින් ඇතැම් පොදු ලක්ෂණ කිහිපයක් හුයකින් එකට ඇමිණීමෙන් ගැටුමට අදාළ සංවේදිතාව පිළිබඳ ඒකාබද්ධ චිත්‍රයක් ඉදිරිපත් කරනු ලබන්නේ යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය විමසුමට ලක් කිරීමේ පදනමක් වශයෙනි.

### ගැටුම පිළිබඳ අත්දැකීම් - **KRI**

> *"ගැටුම නිසා අපි ඉන්දියාවට ගියා. 1985 සිට 1989 අතර කාලය දක්වා අපි ඉන්දියාවේ අනාථ කඳවුරක හිටියා. 1989 දී අපි මුහුදින් මන්නාරමට ආවා. 2001 දී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අපේ ගමේ ගෙවල් කිහිපයක් ගිනි තැබුවා. නාවික හමුදාවෙන් ගම්මුන් කිහිප දෙනෙකුත් මැරුවා."*
>
> *(KRI F 37)*

ගැටුම් පිළිබඳ ව මෙම ප්‍රජාවගේ අත්දැකීම්වල දැකිය හැකි ලක්ෂණයක් වූයේ ඍජු ප්‍රහාරයන් සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රකට අත්දැකීම්වලින් අනතුරුව වරින්වර අවතැන් ව සිටි කාලසීමාවල් සහ නැවත පදිංචි වීම පිළිබඳ කාලසීමාවල් තිබීමය.

> *"අපිට අපේ දේපළ අහිමි වෙලා, 1990 ගණන්වල දී යාපනෙන් අවතැන් වෙලා, මගෙ දරුවන්ගෙ අධ්‍යාපනය කඩා කප්පල් වුණා. ගැටුම නිසා ඒ අයට දිගට ම අධ්‍යාපනය නියමාකාරයට කර ගෙන යන්න පුලුවන් වුණේ නෑ. අපි අපේ ගමෙන් අවතැන් වෙලා, අවුරුදු හතරකටත් වැඩි කාලයක් මනිපායි සරණාගත කඳවුරේ හිටියා. ඊට පස්සේ අපි පුතුක්කුඩියිරුප්පු සරණාගත කඳවුරට ඇවිත්, අන්තිමේ දී අපි මන්නාරමට ආව."*
> *(KRI F 57)*
>
> *"මට තිබුණු සේරම වස්තුව 1983 කැරලි කෝලාහල කාලෙදි නැති වෙලා අපි මඩකලපුවට අවතැන් වුණා. මම ටිකින් ටික මගේ ව්‍යාපාරෙ දියුණු කර ගත්තා. මම එල්.ටී.ටී.ඊ එකට හිතවත් කෙනෙක් කියලා සැක කරලා යුද්ධ හමුදාවෙ රහස් ඔත්තු ඒකකය මට තදින් දඬුවම් කළා. මම එහෙන් පිටවෙලා මන්නාරමට ආවා."*
>
> *(KRI M 55)*
>
> *"ගැටුම් හින්දා අපි ඉන්දියාවට පළා ගියා. 1985 ඉඳලා 1989 වෙන කල් අපි ඉන්දියාවෙ සරණාගත කඳවුරක හිටියා. 1989 දී අපි මුහුදින් මන්නාරමට ආපහු ආවා. 2001 දී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අපේ ගමේ ගෙවල් කිහිපයක් ගිනි තැබුවා, නාවික හමුදාවෙන් ගම්මුන් කීප දෙනෙකුත් මැරුවා."*
> *(KRI F 37)*

තමන් අවතැන්ව සිටි කාලසීමාවල දී පුද්ගලයන්ට මෙන් ම ප්‍රජාවන්ට ද බොහෝ සෙයින් හානි පැමිණ තිබිණ. පෞද්ගලික අත්දැකීම් ප්‍රජාවගේ සාමූහික අත්දැකීම් තුළට කාවද්දන ලදී. ස්වකීය අත්දැකීම්වලින් ඉදිරියට යමින් තම ජීවිත යළි ගොඩ නගා ගැනීමට ඔවුන් කොතරම් සමත් වී ද යන්න විමතිය දනවන කරුණකි.

**ගැටුම් පිළිබඳ අත්දැකීම් - MSL**

අධ්‍යයනයට පාත්‍ර වූ ස්ථාන අතුරින් ඉතාමත් දිළිඳු තත්ත්වයේ පැවතියේ මෙම MSL ප්‍රදේශයයි. මෙම ප්‍රදේශයේ බොහෝ පවුල් නැවත පදිංචියට පැමිණ තිබුණේ අධ්‍යයනය සිදු කිරීමට සාපේක්ෂක වශයෙන් ආසන්න කාලයක දීය. සෙසු ප්‍රජාවන් සමඟ සසඳන විට මෙය පරස්පර තත්ත්වයක් වූයේ යළි පදිංචියට පැමිණීම සම්බන්ධයෙන් සෙසු අය ඔවුනට වඩා දිගු ඉතිහාසයකට හිමිකම් කී නිසයි. මෑත කාලීනව සිදු වූ යළි පදිංචිය ඔවුන්ගේ එක් එක් ගෘහවාසයන් කෙරෙහි බලපා ඇති ආකාරය MSL ප්‍රදේශයේ ගැටුමට අදාළ අත්දැකීම් පිළිබඳ සාකච්ඡාවලින් ඉස්මතු වේ.

> *"අපිට තිබුණු වත්කම් සේරම යුද්ධෙදි නැති වුණා. අපි මේ ගමෙන් පිට වුණේ ඇඳන් හිටිය වස්තර පිටින්. සමහර අයට දිගට ම ඉගෙනීම කර ගෙන යන්න බැරි වෙලා ඒක අතැර දාන්න සිදු වුණා. අපිට අපේ තිබුණු ගරුත්වය නැතිව ගිහින් ඒ අය අපි සරණාගතයො හැටියට හඳුන්වන්න වුණා. ආණ්ඩුවත්, සමාජයත් අපිව මුලුමනින් ම නොසලකා හැරියා. අපි මෙහෙ නැවත පදිංචි වුනාට පස්සෙ අපිට ඡන්දය පාවිච්චි කරන්නවත් ඉඩක් ලැබුණෙ නෑ. ඒ අය මේ ගමට පහර දෙන හැම අවස්ථාවක ම අපිට මෙහෙන් යන්න සිද්ධ වුණා. අපිට කිසි උදව්වක් ලැබුණෙ නෑ. අපිට උදව් කරන්න කිසි සංවිධානයක් තිබුණෙත් නෑ. ජාඉසසයෙන් ගෙවල් 5 හදා දුන්නා. අපි පත් වෙලා ඉන්න තත්වෙ ගැන පිට අයට තොරතුරු දීල ම අපිට ඇති වෙලා තියෙන්නෙ. හැමෝම අපෙන් තොරතුරු ලබා ගන්නවා, ඒත් අපිට ඒවායින් කිසි වැඩක් වෙන්නෙ නෑ. MSL එකේ ඉඳල පුත්තලමට යන පාර වහල නගරයකට යන්න හරිම කරදරයි. පාර අරිනවා නම් අපිට ලේසියෙන් ම අපේ බිස්නස් කරන්න පුලුවන්. ඒක තමා එතෙන්ට යන්න තියන කිට්ටුම පාර."*
> *(MSLF ව, ප්‍රධාන තොරතුරු සපයන්නා)*

> *"අපිට අපේ හාල් මෝලත්, ඇති කළ සත්තු ඇතුළු අතිරේක ආදායම් මාර්ගත් නැති වුණා. අපේ ගෙවල් මුලුමනින් ම විනාස වෙලා ගියා. අපිට අපේ තිබුණු ගරුත්වය නැතිවෙලා ගිහින් ඒ අය සරණාගතයො හැටියට අපිව හඳුන්වන්න වුණා. අවතැන් වුණා ම අපිට හුඟ කරදරවලට මූණ පාන්න සිද්ධ වුණා. යුද්ධෙට කලින් අපේ පවුල හොඳ පෝසත් එකක්. අපි කීප පොළකට අවතැන් වෙලා ගිහින් අන්තිමේ 1990 දී කල්පිටියෙ පදිංචි වුණා. 2002 වෙන කල් අපි එහෙ පදිංචි වෙලා ඉඳලා, අවබෝධතා ගිවිසුමෙන් පස්සෙ මෙහාට ආවා. සිදු වුණු හොඳ වෙනසකට තියෙන්නෙ අවතැන් වුණාට පස්සෙ අපේ පවුලෙ අධ්‍යාපන මට්ටම ඉහළ ගියා. අවබෝධතා ගිවිසුමෙන් පස්සෙ අපි ඇවිත් ආයෙමත් මෙහෙ පදිංචි වුණා. අපේ ම බිමට එන්න ලැබීම ගැන සතුටක් තිබුණට, කලින් තිබුණා වගේ හොඳ නෑ. අපි තාමත් පසුවන්නෙ හොඳ තත්වෙක නෙමේ. අපි තාම ඉන්නෙ එල්.ටී.ටී.ඊ පාලනය යටතෙ. අපිට තාමත් එල්.ටී.ටී.ඊ එකට බදු ගෙවන්න සිද්ධ වෙලා තියෙනවා. ගෙවල් සේරම කැඩිලා බිඳිලා. පාරවල් අබලන්. යුද්ධෙන් පස්සේ පවුල් සේරම අවතැන් වුණා. මේ අවබෝධතා ගිවිසුමෙන් පස්සෙ ඒ අය ටිකින් ටික ආපහු එන්න පටන් අරන්."*
> *(MSL F 30)*

රට තුළ අවතැන් වූ පුද්ගලයන් අවමානයට ලක් කිරීම තම අත්දැකීම් පිළිබඳ ව ප්‍රජාව විසින් සපයනු ලබන තොරතුරුවලින් පෙනෙන්නට තිබෙන අතර, තමන් පත් ව සිටින තත්ත්වය පිළිබඳ ව ඔවුන් තුළ මහත් දොම්නසක් හා නොරිස්සුම් බවක් හට ගෙන තිබෙන බව පැහැදිලිය. මෙම නොරිස්සුම් බව හා අවමානය පිළිබඳ හැඟීම එම ප්‍රජාවන්ට පොදු කරුණක් වන නමුදු KRI සහ MSL ප්‍රදේශයන්හි ප්‍රජා කණ්ඩායම්වල විස්තර අතර දක්වෙන පරස්පරතාව ද සැලකිය යුතු තරම් වූවකි. අත්දැකීම් අතින් සමාන වන නමුදු, යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලියේ දී ඉදිරියෙන් සිටින්නේ KRI ප්‍රදේශයේ ප්‍රජා පිරිසය. නොරිස්සුම් බව පිළිබඳ ඔවුන් අතර පවතින හැඟීම වඩාත් නිහඬ එකක් වන අතර, රට තුළ අවතැන් වූ ජනයා යන පොදු කැළල ද යටපත් ව යන්නට ඉඩ හැර ඇත. MSL ප්‍රදේශයේ ප්‍රජාව කෙරෙහි මෙම කරුණ තවමත් බලපවත්වන අතර එය ඔවුන්ගේ අවධානය යොමු වූ ප්‍රමුඛ කරුණකි. ප්‍රජා කණ්ඩායම්

දෙකෙහි අත්දැකීම් පිළිබඳ පරස්පරතාව මගින් විදහා දක්වෙන්නේ කාලාතික්‍රමණය කෙතරම් වැදගත් සාධකයක් ද යන්නත්, කලක් ගත ව ගිය පසු ප්‍රජාවන් ගැටුමින් ඇති කරන ලද වෙනස්කම්වලට අනුව කටයුතු කරන්නේ සහ ඒවාට අනුගතව හැඩ ගැසෙන්නේ කෙසේදැයි යන්නත්ය.

**ගැටුම පිළිබඳ අත්දැකීම් - NNT**

NNT ප්‍රදේශයේ ප්‍රජාවට බල පෑ සිද්ධීන් ද සෙසු අධ්‍යයන කණ්ඩායම් දෙකට බල පෑ ඒවා ම හෝ ඊට ඉතා සමාන ඒවා වන නමුදු, ඔවුන් ලද අත්දැකීම්වල පරස්පරතාවක් දක්නට තිබේ. එම ප්‍රජාව ද එකී ගැටුම්කාරී පරිසරය තුළ ම වසමින් සෘජු හා වක්‍ර ප්‍රචණ්ඩත්වය අත්විඳ තිබූ අතර, ඇතැම් ගෘහවාසී ජනයා අවතැන් ව සිට පසුව තම ප්‍රජාව අතරට නැවත පදිංචියට පැමිණ තිබේ.

එසේ වුවත්, ඔවුන් හානියට පත් මට්ටම බෙහෙවින් වෙනස් ය. ගැටුමට අදාළ ඔවුන්ගේ අත්දැකීම්වල තීව්‍රබව අධ්‍යයනයට පාත්‍ර සෙසු කණ්ඩායම් දෙකට ම වඩා මඳ බැව් පෙනී යයි. එයට තුඩු දෙන්නට ඇත්තේ ගැටුම හේතුවෙන් එහි බොහෝ ගෘහවාසී ජනයාට තම නිවෙස් හැර යෑමට බල කිරීමක් නොතිබීම හෝ ගැටුම ඔවුන්ගේ ජීවිකා වෘත්තීන්ට සෙසු ප්‍රජා කණ්ඩායම් දෙකට තරම් බල නොපෑමේ හේතුව නිසා හෝ විය හැක.

KRI ප්‍රජාව මෙන් NNT ප්‍රජාව ද යථා තත්වයට පැමිණීම සඳහා ගත කළ වඩා දිගු කාලපරිච්ඡේදය සුරක්ෂිතභාවය සහ සෞභාග්‍යය පිළිබඳ සාපේක්ෂක වශයෙන් වඩාත් ඉහළ හැඟීමක් ඔවුන් තුළ පහළ කිරීමට තුඩු දෙන්නට ඇතැයි සිතිය හැක. (යුද්ධ හමුදාවේ බ්‍රිගේඩියර්වරයා ද ප්‍රජාව හා සමාන ව රෝමානු කතෝලික භක්තිකයෙකු වීමේ හේතුව ද අර්ධ වශයෙන් බලපෑමෙන්) යුද්ධ හමුදාවෙන් ඔවුන් ලද උපකාරය ද ගැටුම පිළිබඳ ඔවුන්ගේ සංජානනයන් වෙනසකට භාජන කිරීමටත්, යථා තත්වයට පත් වීම පිළිබඳ වඩාත් විශාල හැඟීමක් ඔවුන් තුළ ජනිත කිරීමටත් හේතු වන්නට ඇත.

> *"1990 දී ප්‍රශ්නය පටන් ගත් වේලේ, අපිට අපේ ගමට අල්ලපු උයිර්තදාසන් කුලම්වලට යන්න සිද්ධ වුණා. අපි අවතැන් වුවත් බවට පත් වුණා. ඊට පස්සෙ අපි මඩුවලට ගියා. අපේ තාත්තා අසනීප වූ නිසා මම දවසක් දා ගමට ආවා. මාව හමුදාව අල්ලා ගත්තා. අපිට මෙහෙම පදිංචි වෙන්න සිද්ධ වුණා. අපි කලින් ආවා නම් අපිට මෙහි ම පදිංචි වෙන්න තිබුණා. ගැටුම් පැවති කාලෙදී එක හමුදා කණ්ඩායමකට තව හමුදා කණ්ඩායමක් එක්ක ආරවුලක් තිබුණා. අපි බය වෙලා ආපහු මඩුවලට යන්න හැදුවා. ඒත් හමුදාව අපිට යන්න ඉඩ දුන්නෙ නෑ. ඒ කාලෙ හමුදාව බාරව හිටිය බ්‍රිගේඩියර් හොඳ කෙනෙක්. අපි දිගට ම පදිංචි වෙලා හිටියා. ඒත් අපිට අපේ නිෂ්පාදන විකුණා ගන්න බැරි ප්‍රශ්න තිබුණා. මම වෙළඳපොලට ගිහින් බිත්තර විකුණා ගන්නයි පුරුදු වෙලා හිටියෙ. ඒත් හරිහැටි ගමනාගමන පහසුකමක් තිබුණෙ නෑ. අපිට බස් සේවයක් තිබුණෙ නෑ. අපි නිපදවන දේවල් මන්නාරමට ගෙනිහින් විකුණා ගන්න යුද්ධ හමුදාවෙන් අපිට බස් එකක් ලබා දුන්නා. අපිට කෑම බීමෙන් කිසි හිඟයක් තිබුණෙ නෑ. ඕන වෙලාවක අපිට කන්න මොනවා හරි තිබුණා. අපි අපේ වැඩ දිගට ම කර ගෙන ගියා. ටික කලකට පස්සෙ යුද්ධ හමුදාව අපේ ගමෙන් ගියා. ඒ අය ඉන්න කාලෙ අපිට උදව් කළා."*
> *(NNT M 56)*

> *"1990 දී ප්‍රශ්න ඇති වෙන්න පටන් ගත්තා. යුද්ධ හමුදාවෙන් වට කළා ම මන්නාරම, NNT, උයිලන්ගුලම්, අඩම්පන්, තල්ලඩි, මේ සේරම ප්‍රදේශ අහු වුණා. අවුරුදු දෙකක් යන කල් මේ ප්‍රදේශ තිබුණෙ ඔවුන්ගෙ පාලනය යටතෙ. 1990 - 1992 අතර කාලෙ අපිට කිසි ප්‍රශ්නයක් තිබුණෙ නෑ. යුද්ධ හමුදාවෙන් අපිට කිසි ප්‍රශ්නයක් ඇති වුණේ නෑ. ජල සැපයුම නැවතුනා. වැව තිබුණෙ එල්.ටී.ටී.ඊ එක පාලනය කළ හරියෙ හින්දා ඉංජිනේරුවො වැඩට ගියෙ නැති එකෙන් අපිට වතුර ලැබෙන්නෙ නැතුව ගියා. අපි අපේ ඉඩම්වල එළවළුයි, තවත් දේවලුයි වවලා අපි ඒවා මන්නාරම නගරයට අරන් ගියා. ඒවා මන්නාරම නගරයට අරන් යන්න යුද්ධ හමුදාවෙන් අපිට බස් එකක් ලබා දුන්නා. ගැටුමෙන් අපිට ඒ තරම් හානියක් වුණේ නෑ."*
> *(NNT 7 M 54)*

ගැටුමට සම්බන්ධ එක් පක්ෂයක් සමඟ ප්‍රජාව පැවැත්වූ සම්බන්ධතා, වඩාත් අහිතකර බලපෑම් ලිහිල් කරලීමට කිසියම් ප්‍රමාණයකට ඉවහල් වී ඇත.

ගැටුමින් හානියට පත්වීම පිළිබඳ ව එක් එක් අධ්‍යයන කණ්ඩායමකට අදාළ සාමාන්‍ය ප්‍රවණතාවන් හඳුනා ගැනීමට හැකියාවක් තිබුණ ද, අභ්‍යන්තරික ප්‍රවණතාවන් සහ ඒ ඒ මට්ටමේ දී වෙන් වෙන් වශයෙන් විමසා බැලීමෙන් පමණක් දැනගත හැකි හානියට පත්වීම පිළිබඳ විවිධ මට්ටම් මෙම ප්‍රමාණවල දී අවධානයට හසු කර ගෙන නොමැත. ඒ ඒ ප්‍රජාවන්හි සිටින එක් එක් පුද්ගලයන් කෙරෙහි ගැටුම බලපා ඇත්තේ එකිනෙකට වෙනස් ආකාරවලිනි. අධ්‍යයනය මඟින් ගැටුමෙන් හානියට පත්වීමේ ගතිලක්ෂණ දක්වීම් පිළිබඳ කිසියම් පුළුල් ඉදිරිපත් කිරීමකට ප්‍රයත්න දැරුව ද, ගැටුම් පිළිබඳ ව පුද්ගලයන්ගේ අත්දැකීම්වල අභ්‍යන්තරික සංකීර්ණත්වය නොතකා හැරීමක් ඉන් සිදු නොවේ.

## 6. යුක්තිය සහ යථා තත්වයට පත් වීම

මෙම පර්යේෂණයේ එක් වැදගත් ම අංගයක් වන්නේ ගෘහවාසයන්හි සමාජ - ආර්ථික තත්වය යුක්තිය පිළිබඳ අවබෝධයක් ලැබීමට හේතු වී ඇත් ද යන්නත්, ඒ ගැන සොයා බැලීමට ඉන් ඔවුන්ට බලපෑමක් කර ඇත් ද යන්නත් විමසා බැලීමයි. ප්‍රතිචාරකයන් සමාජ - ආර්ථික කරුණු ඔස්සේ පෙළ ගස්වා කොටස්වලට බෙදා දක්වීමෙන් ප්‍රජාවන් යුක්තිය සංජානනය කර ඇත්තේ කෙසේදැයි යන්න විදහා දැක්වීම පිණිස මෙම කොටසින් කෙරෙන්නේ සම්මුඛ සාකච්ඡාවලින් උපුටා ගත් කොටස් ඉදිරිපත් කිරීමකි. යුක්තිය සහ යථා තත්වයට පත්වීම පිළිබඳ ප්‍රජාවගේ අදහස් කෙරෙහි ඔවුන්ගේ සමාජීය හා ආර්ථික තත්වය බලපාන බවට දැක්වෙන කේන්ද්‍රීය උපකල්පනය පරීක්ෂාවට ලක් කිරීම පිණිස ඉහළ, මධ්‍යම සහ පහළ මට්ටමේ ප්‍රජාවන් අතර පවතින විෂමතාව උපයෝගී කර ගෙන ඇත. මෙය මේ අරමුණු පෙරදැරිව කරන ලද කෘත්‍රිම බෙදා වෙන් කිරීමකි. සෑම ප්‍රජාවක් අතර ම විවිධාකාර සමාජ - ආර්ථික තත්වයන්ගෙන් යුත් ගෘහවාසයන් පරාසයක් තිබෙනු දැකිය හැකි වන අතර, පර්යේෂණයේ සොයා ගැනීම මඟින් අනාවරණය කෙරෙන්නේ මෙම පරාසය තුළින් යුක්තියේ යාන්ත්‍රණයන් පිළිබඳ ඔවුන්ගේ වරණයන් සහ එම වරණයන්ට හේතු සොයා ගත හැකි බවයි. මෙම වෙන් කිරීම සිදු කරන ලද්දේ සමාජ - ආර්ථික මට්ටම්වල පරාසයක් තිබෙන බව පිළිබඳ අදහස තහවුරු කරලීමටත්, මෙම පරාසයේ විවිධ ස්ථානයන්හි දී ගෘහවාසයන් විසින් යුක්තිය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් අනුපූරක තොරතුරු සපයන බව දක්වීමටත්ය.

සෑම සමාජ - ආර්ථික ගණයක් ම අයත් ගෘහවාසයන්හි ප්‍රතිචාරකයන් එකිනෙකට වෙනස් ආකාරවලින් යුක්තිය තේරුම් ගෙන සිටියද. පොදු ලක්ෂණයක් වූයේ ඒ කිසිවෙකුත් (උසාවි පද්ධතිය සහ සිවිල් පොලීසිය යනුවෙන් දක්වෙන) යුක්තිය පසිඳලීමේ විධිමත් යාන්ත්‍රණයන්හි පිහිට පැතීම අපේක්ෂා නොකළ බව පර්යේෂණයෙන් හෙළි වේ. ඒ වෙනුවට ඔවුන් පිහිට පැතීමට වැඩි නැඹුරුවක් දක්වූයේ තම ප්‍රජාව තුළින් ම පැන නැගුණු යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන් වෙතින් හෝ ඉතා විරල වශයෙන් තම ප්‍රජාව සමඟ නිරතුරුව වසන හෝ ඒ ආසන්නයේ ම වසන පහළ මට්ටමේ රාජ්‍ය නිලධාරීන් වෙතිනි. ප්‍රජාවන් සහ විවිධ සමාජ - ආර්ථික මට්ටම්වල පසු වූ ජනයා විසින් යුක්තිය අවබෝධ කර ගෙන සිටි ආකාරය විධිමත් නෛතික යුක්තිය පිළිබඳ ව තිබූ සාම්ප්‍රදායික මතයන් සමඟ සෑමවිට ම බැඳී නොතිබූ අතර, එම අවබෝධය වඩාත් නැඹුරුව තිබුණේ තමන්ට සමීප ව තිබෙන කුමන හෝ ක්‍රමයකින් තම ගැටළු විසඳා ගැනීම කෙරෙහි ය. තම තත්වය නිසා උසස් ආකාරයේ යාන්ත්‍රණයන්ට වඩාත් පහසුවෙන් පිවිසීමේ හැකියාව තිබූ ප්‍රතිචාරකයන් පවා ඒවා තෝරා ගැනීමට පෙළඹුණේ නැත. විධිමත් යාන්ත්‍රණයන්ට වඩා ප්‍රජාව මඟින් ලබා දෙන විසඳුම්වලට පිවිසීම කෙරෙහි වැඩි මනාපයක් දක් වූ කරුණු ලෙස පෙනී යන ප්‍රබල හේතු සමහරක් මෙම පත්‍රිකාවෙන් ඉදිරිපත් කෙරෙනු ඇත.

### පහළ මට්ටමේ සමාජ - ආර්ථික තත්වය

මෙම ගණය යටතේ ගෘහවාසයන් පෙළ ගස්වා ඇත්තේ භෞතික වත්කම් නොමැති වීමත්, තම සමාජ - ආර්ථික තත්වය පිළිබඳ ව ඔවුන් විසින් ම කරන ලද විස්තරත් පදනම් කර ගෙන ය. මෙම කොටසින් ඉදිරිපත් කෙරෙන්නේ මෙකී ගණයට අයත් ගෘහවාසයන් විසින් යුක්තිය පිළිබඳ ව පළ කර ඇති තම අදහස් ය.

> *"අහිංසකයෙකුට කවුරු හරි කෙනෙක් වැරදි දෙයක් කළොත් ඒකට 'කුත්‍රම්' කියා කියනවා. අපේ දේපළ විනාස වෙලා අපිව අවතැන් වුණා. අපි අහිංසකයි. ගැටුම තිබුණු කාලෙ අපි දුක් වින්දා. කාටවත් වරදක් නොකර අපි තාමත් දුක් විඳිනවා. මට පේන විදියට ඒක එක 'කුත්‍රමක්'.*

*අපිට දැන් අහගිහකම් ඇති වෙලා තියෙනවා. කාගෙන්වත් යුක්තිය ඉල්ලා හිටින්න මට ඇති ප්‍රශ්නයක් නෑ. මට ප්‍රශ්නයක් තියනවා නම් මම අපෙ අම්මා ළඟට ගිහින් ඒක කියනවා. අපෙ අම්මා (අපි අතර ඉන්න නම් දරාපු යහපත් කරුණාවන්ත අය සහ වැඩිහිටියො වැනි) ගමේ ඉන්න අනිත් අය ළඟට (යුක්තිය පතා) යනවා.*

*KRI වල අපි පදිංචි වුනාට පස්සෙ තාම අපිට කිසි ප්‍රශ්නයකට මූණ පාන්න වෙලා නෑ. ඒ අපි කාටවත් වරදක් නොකර අපේ පාඩුවෙ සමාදානෙන් මෙහෙ ජීවත් වන හින්දා වෙන්නැති. අනික් අයත් ඒ විදියයි. ඒ සේරම අය ගැටුමෙන් හානියට පත් වෙලා.*

*අපි අසරණ, අහිංසක උදවිය. මොනවා හරි වුනොත් අපි ඒක දිගට ම ගෙනි යන්න කැමති නෑ. ඒ අපිට සල්ලිවත්, පිළිගැනීමක්වත් නැති නිසයි. අපිට අනාගතය ගැන හිතන්න වෙලා තියෙනවා. පෝසතෙකුට ප්‍රශ්නයකට මූණ දෙන්න වුනොත්, ඔහු ඒ ගැන දිගට ම කටයුතු කරලා උසාවි යනවා."*
*(KRI F 17)*

සම්මුඛ සාකච්ඡාවෙන් පිළිබිඹු වන්නේ කිසිදු අපරාධයකට සම්බන්ධ නොවූ තමන් ගැටුමට ඇදී ඇත්තේ නොදැනුවත්ව ම බවටත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් තමන්ට පීඩා විඳීමට සිදු වූ බවටත් බොහෝ ප්‍රතිචාරකයන් දරන ආකල්පයේ ස්වරූපයකි. සමාජ - ආර්ථික තත්ත්වය පුද්ගලයන්ට තම ගැටළු කෙරෙහි අවධානය යොමු කරවා ගැනීමට සැලසී තිබෙන මාර්ගය ද වැඩි කිරීමට ඉවහල් විය හැකි බවට තිබෙන සංජානනය ද ඉන් හුවා දක් වේ. තම පවුලේ තත්ත්වය පිළිබඳ ව ප්‍රතිචාරකයා තුළ වූ සංජානනය මෙම ආකාරයේ අවබෝධයක් ඇති කරලීම කෙරෙහි දැඩි ලෙස බලපා ඇත. එය යුක්තිය කෙරෙහි ඇති වෙනත් පිවිසුම් පිළිබඳ ව අදහස් පළ කිරීමකි. වඩාත් ඉහළ මට්ටමක සමාජ බලපෑම් කිරීමේ හැකියාව ඇති වඩාත් ඉහළ සමාජ - ආර්ථික තත්ත්වයේ පසු වන ජනයා මුහුණ දෙන වෙනස් ආකාරයේ අවස්ථාවන් අනුගමනය කිරීමට හෝ අපේක්ෂා කිරීමට ජනයා අදහස් නොකරන අතර, එම ආදර්ශයෙන් දක්වෙන්නේ අනෙක් සංජානනයයි. එනම්, වෙනස් ආකාරයක අවස්ථාවන් යටතේ පවත්නා ජීවිතය පිළිබඳ වූ වෙනත් ආකාරයක මාර්ගයක් පිළිබඳ මතයකි.

එබඳු ගැටළු වඩාත් දුරදිග ගෙන නොයෑමට එක් හේතුවක් වන්නේ තම ප්‍රජාව පිළිබඳ ව ඔවුන් තුළ පවත්නා හැඟීම සහ ප්‍රජාව තුළ පවුල්වලට ඇති පිළිගැනීම දිගට ම පවත්වා ගෙන යෑමය. ඔවුන්ගේ ආධාරක ව්‍යුහය ප්‍රජාව වන හෙයින් එය දිගට ම පවත්වා ගෙන යෑම වටනේය. මින් අදහස් කෙරෙන්නේ ප්‍රජා ව්‍යුහය බිඳ ගෙන යෑම සහ පවුල්වල සමාජ - ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම මඟින් තම ගැටළු පිළිබඳ ව කටයුතු කිරීමට විවිධ මාර්ග සලසා ගැනීමට ඉඩ තිබෙන බවය. මෙය මෙම ගෘහවාසයන්ට ආසන්න ව තිබෙන විකල්පයන්ට බලපෑමට ඉඩක් නොමැති යැයි සංජානනය කරන ලද අවස්ථාවන් මත පදනම් වූ පරමාදර්ශයකි. මෙම පර්යේෂණයෙන් යෝජනා කෙරෙන්නේ එක් එක් ප්‍රජාවක සහ ඒ තුළ පිහිටි එක් එක් ගෘහවාසයක් තුළ පවත්නා සහසම්බන්ධතාව අනුව මෙම ගැටළු කෙරෙහි අවධානය යොමු කළ යුතු බවයි. සෑම සහසම්බන්ධතාවකට අනුව ඇතැම් අවස්ථාවන් සීමා වන අතර, වෙනත් ඒවා ඉදිරිපත් වනු ඇත.

පහත දක්වෙන උද්ධෘතය ගැටුමින් ගෘහවාසයට හානි පැමිණියේ කෙසේ ද යන්නත්, එම අත්දැකීම් පිළිබඳ ව ගැඹුරින් මෙනෙහි කිරීමේ දී ඒවා යුක්තිය පිළිබඳ ව ඔවුන් තුළ පවත්නා අදහස් විචිත්‍ර කළ ආකාරයත් විස්තර කරයි.

*"අපි මුලින් ම පදිංචි වෙලා හිටියෙ තිරුකේතීස්වරම්වල. මගෙ දෙමාපියො ගොවියො. මගෙ දෙමාපියො නකතල්වෝවල ගොවිතැන් වැඩ කරමිනුයි හිටියෙ. අපිට ස්ථිර ගෙයක් තිබුණා. අපෙ අම්මා කියනවා අපි 1990 දී අවතැන් වෙලා, ඉන්දියාවට ගිහින් පලනිවල හිටියලු. අපි ඉඳලා තියෙන්නෙ කඳවුරක. අවතැන් වුනාට පස්සෙ අපෙ තාත්තා බීමට පුරුදු වෙලා තාත්තාත් අම්මත් අතර රණ්ඩු ඇති වෙන්න පටන් ගත්තා. පවුලෙ සමාදානයක් තිබුණෙ නෑ. අපෙ අම්මා කියන විදිහට 1992 දී අපිට ඉන්දියාවෙන් ආපහු එන්න සිද්ධ වෙලා තියනවා. රට ඇතුළෙ අවතැන් වූ අයට දෙන දීමනාවෙන් විතරයි අපිට ජීවත් වන්න වුණෙ. අපේ තාත්තට ස්ථිර ආදායමක් තිබුණෙ නෑ. අපෙ අම්මා කියනවා ඒ අයට ආණ්ඩුවෙන් වියළි ආහාර සලාක ලැබුණලු. අපිට වැසිකිළි පහසුකම්වත් වතුර පහසුකම්වත් තිබුණෙ නෑ. අපෙ අම්මාට හරියට දුක් විඳින්න සිද්ධ වුණා. අපේ තාත්තගෙ හැසිරීම හින්දා අම්මා දිවි නසා ගන්නත් හැදුවා. අම්මා*

*කොච්චර පීඩාවට පත් වෙලා හිටිය ද කිව්වොත් වරක් වස බිව්වා. අතීත සිදුවීම් හින්දා අම්මා මානසිකව වැටිලා හිටියෙ."*
*(KRI F . 17)*

සටන් විරාම ගිවිසුමෙන් අනතුරු ව තමනට කිසි ප්‍රශ්නයක් නැතැයි යන්නත්, එම සටන් විරාමයේ ප්‍රතිඵලයක් වශයෙන් ඍජු ප්‍රචණ්ඩත්වයක් නොමැති වීමත් බොහෝ සම්මුඛ සාකච්ඡාවල දී ප්‍රතිරාව දුනි. අධ්‍යයනයට පාත්‍ර වූ ජනයා තම අතීත අත්දැකීම් දකිනු ලබන්නේ තමන්ට පිවිසීමට අවකාශ ඇති යුක්තිය පිළිබඳ විෂයපථයට බැහැරින් පිහිටි ඒවා ලෙසිනි. මෙම කරුණ ඔවුන්ගේ සමාජ - ආර්ථික තත්වය පිළිබඳ විෂමතා නොතකා, ප්‍රජාව සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවල දී ඉස්මතු වූ පොදු ප්‍රවණතාවකි.

තමන් සාමූහික වශයෙන් පීඩාවට පත් වූ බවට ප්‍රබල හැඟීමක් ප්‍රජාව වෙතින් ඉස්මතු වන බව, "අනිත් අයටත් ඒ වගේ" සහ "ගැටුමෙන් හැමෝට ම හානි සිදු වුණා" වැනි කියමන්වලින් ස්ඵුට විය. අධ්‍යයනය සඳහා දායක වූ හානියට පත් සැම ප්‍රජාවක් ම හුවා දැක් වූයේ ස්වකීය සාමූහික අත්දැකීම් සහ ඒවා පිළිබඳ ව තමන් සාමූහික ව කටයුතු කළ ආකාරයයි. යුක්තිය පිළිබඳ ව ඔවුන් අනුගමනය කළ ප්‍රජාමූලක යාන්ත්‍රණයන් මගින් ඔවුන්ගේ මෙම ස්ථාවරය පිළිබිඹු කෙරේ.

*"යුක්තිය සැම දෙනාට ම එක සමාන වන්න ඕන. යුක්තිය දැන ගන්න අපිට අවබෝධයක් තියෙන්න ඕන. අපි සැම ආගමකට ම, සැම ජනවර්ගයකට ම ගරු කරන්න ඕන. යුක්තිය සම්බන්ධයෙන් කිසිම බැරෑරුම් ගැටළුවකට අපි මුහුණ දෙන්නෙ නෑ. අපිට තියන ලොකුම ප්‍රශ්නය දියුණු වෙන්න සල්ලි හොයන එකයි. සමහර වෙලාවට අපි ග්‍රාමසේවක ළඟට ගිහින් අපේ ප්‍රශ්න විසඳා ගන්නවා. අපේ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන්න කවුරුවත් නෑ."*
*(KRI M 50)*

ප්‍රතිචාරකයන් තුළ යුක්තිය සහ යුක්තියට අදාළ ගැටළු පිළිබඳ ව ඇති අවබෝධයන් ආර්ථික කරුණුවලින් පරිබාහිර වූ ඒවා බව සැලකීම සිත්ගන්නාසුලු කරුණකි. මෙම 'සමාජ - ආර්ථික' ගණයට වැටෙන ජනයා මුහුණ පා සිටින 'ගැටළුව', විශේෂයෙන් ම තම ජීවිකා වෘත්තීන් යළි ගොඩ නගා ගැනීමට සහ ඔවුන්ගේ දෛනික දිවිපැවැත්මට අදාළ වූවකි. වඩාත් පුළුල් හා වඩාත් සාකල්‍ය අර්ථයෙන් ගත් කල, යථා තත්වයට පැමිණීම වූ කලි සමාජ - ආර්ථික අංශයන්ගෙන් යථා තත්වයට පත් වීම යන්නට කෙතරම් බද්ධ වූ දෙයක් ද යන්න අනාවරණය කෙරෙන අතර ම, අතීත අත්දැකීම් සඳහා යුක්තිය පිළිබඳ කාරණය ඇතැම්විට සාපේක්ෂක වශයෙන් එතරම් වැදගත් නොවන බව ද හුවා දැක් වේ.

*"නෑ, අපි කිසිම දෙයක් ගැන ලොකු ප්‍රශ්න ඇති කර ගත්තෙ නෑ. අපේ ජීවිතයේ දී අපි නොසෑහෙන්න දුක් වින්දා. ඒ හින්දා අපේ ප්‍රශ්න අපිම විසඳා ගන්නවා. නැත්නම් අපි ඒවා විඳ දරා ගන්නවා. අපිට දැන් එතරම් බැරෑරුම් ප්‍රශ්න මුකුත් නෑ. ඒ හින්දා අපි සාමයෙන් ජීවත් වෙනවා. අපිට බැරෑරුම් ප්‍රශ්නයක් ආවොත් අපි පොඩියන්ලා හමුවෙන්න ගිහින් ඒ ගැන ඔවුන්ට කියනවා. එතකොට කරන්නෙ මොකක්ද කියා ඔවුන් අපිට කියනවා. අපි ඊට එහා යන්නෙ නෑ. අපි පොලීසියටවත්, උසාවිවලටවත් යන්නෙ නෑ."*
*(MSL F.32)*

උද්ධෘත දෙකටම පොදු එක් අංගයක් වන්නේ ප්‍රජාව තම ගැටළු ඔවුන් අතර ම ගැවසෙන පහළම මට්ටමේ රජයේ නියෝජිතයා වන ග්‍රාමසේවක නිලධාරියාට හෝ පොඩියන්ලාට හෝ එල්.ටී.ටී.ඊයට පැවසීමය. ඔව්හු ඒ සඳහා උසාවි හෝ පොලීසි ඇඳා නොගනිති.

*"මම දන්නෙ නෑ මොනවා කියන්න ද කියලා. ඒ වුනත් මම මගෙ ජීවිතයේ දී හුඟක් දුක් විඳලා තියෙනවා. අපිට අපේ ගෙවල් දාලා යන්න සිද්ධ වුණා. අපි අපේ දරුවනුත් අරගෙන තැනින් තැනට දිව්වා. මගෙ සැමියාට බැරි වුණා අපිට කන්න මුකුත් හොයා ගන්න. කිසි වරදකට නැතුව අපිට දුක් විඳින්න වුණා. අපි කාටවත් වරදක් කරල නෑ. මේ සේරම අපරාධ. මේ ගමේ කවුරුවත්, කාටවත් වරදක් කරලා නෑ. දවල් දවසෙ ගමේ පිරිමි උදවිය වැඩට යනවා. ඒ අය ආපහු එන්නෙ හැන්දෑව, නැත්නම් රෑට. ළමයි පාසල් යනවා. මේ තමා (පෙන්වා දෙමින්) අපේ පල්ලිය. අපි පදිංචි වෙලා ඉන්නෙ ඒක ඉස්සරහ. මෙහෙ අනිත් වැඩිහිටියො, ලෙබ්බෙලා ඉන්නවා. ඒ හින්දා අපිට බැරෑරුම් ප්‍රශ්න නෑ. දැන් අපිට ග්‍රාම සංවර්ධන කමිටුවක් තියනවා. අපිට ප්‍රශ්නයක් තියනවා නම් අපි ඒව ලෙබ්බෙලාට කියනවා. ඔවුන් ඒ ගැන කමිටුවෙදි සාකච්ඡා*

*කරනවා. ඔබට පේනවා ඇති නෙ, අපි මෙහෙ ඉන්නෙ පවුල් කීපයයි. අපිට හැමෝම ඕන වෙනවා. ඒ හින්දා මෙහෙ අපරාධ සිද්ධ වෙන්නෙ නෑ. පවුල්වල අඬදබරවත් නෑ. අපි කුරාන් එකට අනුවයි ජීවත් වෙන්නෙ. අපි ආත්ම දමනය ඇති අය. අපි කුරාන් පොතේ තියන 'වලිකට්ටු' (මාර්ගෝපදේශ) පිළිපදිනවා. එකෙන් කියැවෙන්නෙ සාමය සහ සමගිය ගැන. අපිට අපේ ආගම ගැන හොඳ විශ්වාසයක් තියනවා. සුළු, සුළු ප්‍රශ්න ආරවුල්ව මැදි වුන පක්ෂ දෙකත්, ගමේ අනිත් අයත් රැස් කරල පල්ලියම ඒවා විසඳනවා. පෝසත් උදවියට ඕන දේකට මුදල් වියදම් කරන්න පුලුවනි. ඒ අයට ලොකු තැන්වලට යන්න පුලුවන්. ඒ අයට උසාවි යන්න පුලුවන්."*
*(MSL F.39)*

තමන් ලද අතීත අත්දකීම් ද අපරාධ ලෙස සිතා සිටි කල්හි පවා ඒවාට යෙදිය යුතු පිළියම හෝ යුක්තිය ගැන ඔවුන් තම අදහස් පළ කළේ නැත. අතීතයට අදාළ කටයුතු අවසන් කර ඇති නිසා හා තමන්ට ගම් බිම් හැර යෑමට සිදු වූ නිසා හෝ, එසේත් නැත්නම් ඒ ගැන කටයුතු කිරීමට ඇති වෙනත් ආකාරයක් ගැන හෝ ඔවුනට තිබුණේ අල්ප බලාපොරොත්තුවක් නිසා අතීතය ගැන අවධානය යොමු කිරීමෙන් පලක් නොවන හෙයින් ප්‍රතිචාරකයන් සෑමවිට ම සිය අවධානය එල්ලගත කරන ලද්දේ තමන් පසු වන වත්මන් අවස්ථාවන් සහ තමන් මුහුණ පා සිටින වත්මන් ගැටළු කෙරෙහිය.

සෑම පුද්ගලයෙකුට ම අනෙකා අවශ්‍ය වන්නේ යැයි යන අන්‍යොන්‍ය විශ්වාසය මත පදනම් වූ ඔවුන්ගේ ප්‍රබල ප්‍රජා හැඟීම ඉතා ශක්තිමත් එකක් වන අතර ඔවුන් තම ආරවුල් විසඳා ගන්නා ආකාරය කෙරෙහි එහි බලපෑම් දක්නට තිබේ. ප්‍රජාව විසින් තම අනන්‍යතාව තුළින්ම ගොඩ නගා ගන්නා ලද ව්‍යුහයකින් සිය ආරවුල් විසඳා ගැනීම එහි විශේෂත්වයකි. එබඳු ව්‍යුහයන්ට අති විශාල නිත්‍යානුකූල බවක් සහ පිළිගැනීමක් ඉහත කල සිට ම තිබෙන නිසා එය ඔවුන්ගේ ප්‍රජා ජීවිතයට අභ්‍යන්තර වූවකි. එසේ හෙයින් එය ඔවුන්ගේ ප්‍රජා ජීවිතයට ම බද්ධ වූවක් වන අතර, ගැටුම පිළිබඳ ලද අත්දකීම්වලට සමාන ව එයට ද හානි පැමිණ තිබේ. මෙම කරුණු යුක්තියට අදාළ 'ගැටළු' වලට ප්‍රජාව තුළින් ම විසඳුමක් ලබාදීම කෙරෙහි තවදුරටත් බලපා ඇත. තමන් අහිංසක බවත්, වරදක් කර නොමැති බවටත් ජනයා තුළ හැඟීමක් ජනිත ව තිබූ නිසා සම්මුඛ සාකච්ඡාවේ දී 'අයුක්තිය' පිළිබඳ ඔවුන් වෙතින් පළ වූයේ ප්‍රබල හැඟීමකි. මෑතකාලීන ව කරන ලද ඔවුන් නැවත පදිංචි කරවීම සහ ඔවුන්ගේ ජීවිත සහ ජීවිකා වෘත්තීන් ප්‍රතිෂ්ඨාපනය කිරීමට අවස්ථාවක් නොතිබීම සමඟ ඈඳුණු ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නංවා ගැනීමට බාධක වශයෙන් පවත්නා වත්මන් පීඩාවන් සහ දුෂ්කරතාවන් ඔවුන් තුළ වූ අයුක්තිය පිළිබඳ හැඟීම තවදුරටත් උග්‍ර කරවීමට ඉවහල් වී තිබේ.

**මධ්‍යම මට්ටමේ සමාජ - ආර්ථික තත්වය**

මෙම ගණයට අයත් වන්නා වූ ගෘහවාසයෙන් පදනම් වී ඇත්තේ ඔවුන්ට නියත ස්ථිර ආදායම් මාර්ගයක් තිබේ ද යන්න සහ කිසියම් ආර්ථික වත්කම් ප්‍රමාණයකට හිමිකම් කියනු ලබන්නේ ද යන්න මත මෙන් ම ප්‍රතිචාරකයන් විසින් ම දක්වන ලද වර්ග කිරීම අනුවය. යුක්තිය පිළිබඳ ව ඔවුන්ගේ අදහස් ප්‍රබල ආකාරයට පදනම් ව තිබුණේ ද ප්‍රජාවක් ලෙස කටයුතු කරමින් තම ප්‍රජාව තුළින්ම ස්වකීය 'ගැටළු' විසඳා ගැනීම කෙරෙහි ය.

*"මන්නාරම සාමකාමීව තිබුණෙ නෑ. 1983 කැරලිකෝලාහල වලින් පස්සෙ අපිට ප්‍රශ්න මතු වුණා. දවසක් දා මම නගරයට ගියා. මම දැක්කා පිරිමි ළමයෙකුට වෙඩි වදිනවා. මේක මම ලබපු අත්දකීමක්. මගෙ සැමියාව අත්අඩංගුවට ගත්තා. ඔහුව දවසක් අත්අඩංගුවෙ තියා ගෙන ඉඳලා පහුවදා නිදහස් කළා. අපේ පවුලෙ කාගෙවත්, අපි දන්න අය කාගෙවත් ජීවිත හානි වුණේ නෑ.*

*අපිට බොහොම භයානක තත්වයක් යටතෙ ඉන්න වුණේ. ඊළඟ මොහොතෙ මොකක් වේවි ද කියල කියන්න පුලුවන්කමක් කාටවත් තිබුණෙ නෑ. අපි ඉන්දියාවට ගියාට පස්සෙ අපේ ගේ මුලුමනින් ම කඩා බිඳ දාලා, අපේ ඉඩම විතරයි ඉතුරු වෙලා තිබුණෙ. මගෙ සැමියා හොඳින් ධීවර පන්නෙ කර ගෙනයි හිටියෙ. ඔහුගෙ මාලු දැලුයි, අනිත් ආම්පන්න සේරමයි නැති වුණා.*

*මේ ලෝකෙ හරියට අපරාධ සිද්ධ වෙනවා. කවුරු හරි තව කෙනෙකුගෙ ජීවිතයට කරදරයක් කළොත්, කවුරු හරි නොකළ යුතු දෙයක් හරි වැරදි දෙයක් හරි කළොත්, ඒක අපරාධයක් විදිහටයි මම කල්පනා කරන්නෙ.*

*අපි අපේ ප්‍රශ්න විසඳා ගන්න සාමාන්‍යයෙන් උසාවියටවත්, පොලීසියටවත් යන්නෙ නෑ. අනිත් කාරණේ, උසාවි ගෙන යන්න තරම් ලොකු ප්‍රශ්න අපිට මෙහෙ නෑ. අපිට මෙහෙ තියෙන්නෙ සුළු, සුළු ප්‍රශ්න. ඒවට විසඳුම් ලබාගන්න අපිට මෙහෙ ගමේ කමිටුව තියනවා. අපි ඒකට ගිහින් සාකච්ඡා කරනවා. සල්ලි තියන අයයි, බලේ තියන අයයි, ඒ අයට හැම දෙයක්ම තියන නිසා බයක් නැතුව තමුන්ගෙ ප්‍රශ්න ගැන කටයුතු කරනවා."*
*(KRI F.43)*

ප්‍රතිචාරකයන් යුක්තිය දෙස බලන්නේ තමන්ට ගැටුමින් හානි පැමිණ ඇති ආකාරය පිළිබඳ සහසම්බන්ධතාවෙන් යුතුවය. අධ්‍යයනයට පාත්‍ර වූ සියලු ම ප්‍රජාවන් තුළින් දිස් වූ ගැටුම් පිළිබඳ ප්‍රවණතාවන් බොහෝ දුරට එක හා සමාන වූ අතර, අත්දැකීම් පිළිබඳ යම්කිසි වෙනස්කම් දක්නට තිබුණ ද, ඔවුන් යුක්තිය සංජානනය කළ ආකාරය පිළිබඳ ව ඉන් සැලකිය යුතු තරම් බලපෑමක් නොකෙරුනු බව ද අවධාරණය කර දැක්වීම වැදගත්ය.

මැදිහත් වීමේ මාර්ගයක් වශයෙන් ග්‍රාම කමිටු ඉටු කරන කාර්යයෙන් පිළිබිඹු කෙරෙන්නේ මෙම ගණයට අයත් බොහෝ පුද්ගලයින් යුක්තියට අදාළ 'ගැටළුවලට' එමගින් සහනය පැතූ ආකාරයයි.

*"ගම හරිම එක්සත්. අපිට ප්‍රශ්න නෑ. මුස්ලිම් පවුල් දෙක තුනක් ඇරුනාම, අපි අනෙක් සේරම දෙමළ අය. හුඟ දෙනෙක් රෝමානු කතෝලික. අපි එක් එක්කෙනා නෑදෑයො. පැන නගින ඕනෑම ප්‍රශ්නයක් ගමේ කමිටුවෙන් විසඳනවා. අවබෝධතා ගිවිසුමට කලින් මිනිස්සු තමන්ගේ දුක්ගැනවිලි කිව්වෙ එල්.ටී.ටී.ඊ එකට. ඒ අය අපිට විසඳුම් දුන්නා. මිනිස්සු ඒවා පිළිගත්තා. ඒ අයගෙ කමිටු හැඳින්වුනේ 'මක්කල් සබයි', 'ඉනක්ක සබයි' (ජනතා කමිටු, මැදිහත්වීමේ කමිටු) කියන නම්වලින්. දැන් අපි අපේ ප්‍රශ්න යොමු කරන්නෙ මේ ගමේ කමිටුවට. විසඳුමක් දෙන්න ඒ අය සමහර වෙලාවට මාස 6 ක් කල් ගන්නවා. 'ප්‍රිජෙකල් කුලු' කියල එකකුත් තියනවා. මානව අයිතිවාසිකම් කඩවීමක් හරි, අතුරුදහන් වීමක් හරි වුනොත්, අපි ඒ සභාවට යනවා. ලොකු අපරාධෙකටත් අපි ඒකට තමා යන්නෙ. මුලින් ම ඔවුන් ඒක නිතිපතා පවත්වන රැස්වීමක දී විභාග කරනවා. ඒක බැරෑරුම් ප්‍රශ්නයක් නම් මන්නාරමේ බිෂොප්වරයා වන රායප්පු ජෝසප් පියතුමා ළඟට අරන් යනවා. එතෙන්දි ඔහු තමා තීරණය කරන්නෙ ඒක උසාවි ගෙනි යන්න ඕන කාරණයක් ද, නැද්ද කියල. ඕන වුනොත් ඔහු පළාතෙ මන්ත්‍රීවරයාට කතා කරනවා. නීතිවිරෝධී විදිහට රඳවා ගෙන ඉන්න පුද්ගලයෙක් පිළිබඳ කාරණාවක් නම් ඔහු ඒ පුද්ගලයා බලන්න යනවා. 1990 ට කලින් ඔහු අපේ ගමේ කෙනෙකුට උදව් කළා. ඒ හාදයා අතුරුදහන් වෙලා කියල ඒ හාදයාගේ පවුලෙ අයගෙන් ඔහුට පැමිණිල්ලක් ලැබුණා. පියතුමා අවුරුදු දෙකක් යන කල් ඔහු ගැන හොයලා, අන්තිමේ දී ඔහුව හොයා ගත්තා."*
*(NNT M 56)*

ප්‍රජාවන්ට යුක්තිය පිළිබඳ කරුණු ගැන කටයුතු කිරීමට තිබෙන ව්‍යුහය හැඩ ගස්වනු ලබන්නේ ඔවුන්ගේ ම අනන්‍යතාව සහ ඔවුන් පත් වන අවස්ථාවන් අනුවය. මෙම ව්‍යුහයන් ගතික ස්වභාවයෙන් යුත් ඒවා වන අතර, ඒවා මගින් ප්‍රදේශය තුළ වෙනසට භාජන වෙමින් පවතින බල සමතුලනයන්හි සහ බලපෑම්වල මට්ටම් පිළිබිඹු කෙරේ. ප්‍රජාමූලක ආගමික මැදිහත්වීමේ පද්ධතිවල ප්‍රබලත්වය විශේෂයෙන් කැපී පෙනෙන කරුණකි. MSL ප්‍රදේශයෙහි මෙය මුස්ලිම් පල්ලිය සහ ඔවුන්ගේ ආගමික නායකයන් වටා සංවිධානගත ව තිබූ අතර NNT ප්‍රදේශයෙහි මෙය සංවිධානගත ව තිබුණේ කතෝලික පල්ලියේ පූජක මඬුල්ල වටාය. ගැටුමට ඇදුණු පාර්ශවයන් ලෙසට සහ ප්‍රජාව අත්විඳින දුක්පීඩාවන්ට හේතුකාරක ලෙසට සලකනු ලබන වෙනත් දේශපාලන, රාජ්‍ය හෝ යුද්ධමය ව්‍යුහයන්ට වඩා මෙම ව්‍යුහයන් කෙරේ ප්‍රජාවන් අතර බෙහෙවින් ඉහළ පිළිගැන්මක් හා නිත්‍යානුකූලබවක් තිබෙන බැව් සැලකීම වැදගත් වේ.

*"දැන් අපිට අපේ පියතුමාගේ (ප්‍රදේශයේ පල්ලියේ පූජකතුමා) ප්‍රධානත්වයෙන් ගමේ කමිටුවක් තියනවා. අපි අපේ පුද්ගලික ප්‍රශ්නයක් ඒකට යොමු කළොත්, පියතුමාත්, කමිටුවත් ඒ ගැන විභාග කර බලලා තීන්දුවක් ගන්නවා. මේ තීන්දු බලගතුයි. අපි සේරම දෙනා රෝමානු කතෝලික අය නිසා අපි ඒකට ඇහුම්කන් දෙනවා. මම තමා ග්‍රාම සංවර්ධන සමිතියෙ ලේකම්. හින්දු පවුල් 20 ක් හිටියත් ඒ අයත් තමන්ගෙ ප්‍රශ්නවලට විසඳුම් හොයන්නෙ මේ කමිටුව මාර්ගයෙන්. ඒ අයට අපේ පියතුමා විශ්වාසයි."*
*(NNT M54)*

යුක්තිය පිළිබඳ ව ප්‍රජා පද්ධතියන්හි දක්වෙන තවත් අංශයක් මින් හුවා දක් වේ. බහුතර ප්‍රජාවගේ ප්‍රබල අනන්‍යතාව මත පදනම් වූ පද්ධතිවලින් පවා එම ආගමට අවශ්‍යයෙන් ම සම්බන්ධ නොවන වෙනත් සාමාජිකයන් විසින් ප්‍රයෝජන ගනු ලබන්නේ කෙසේදැයි යන්න ඉන් විස්තර කර දක්වේ. මෙම පද්ධති ඔවුන්ගේ අනන්‍යතා ලක්ෂණ ඔස්සේ බෙදා දක්විය නොහැකි බව ඉන් නිදර්ශනය කෙරේ. එබඳු අනන්‍යතාවන් ගැටුම තවදුරටත් දිග් ගැස්සීමට පදනමක් වශයෙන් යොදා ගන්නා අවස්ථාවක මෙය වැදගත් කරුණකි. මෙම ක්‍රියාවලිය සඳහා ප්‍රජාව අතර සිටින හින්දු භක්තිකයන් ද ඇතුළත් කර ගැනීම සහ ඔවුන්ට විසින් එම ක්‍රියාවලිය පිළිගන්නා බවට පෙනී යෑම ධනාත්මක සමාජ සම්බන්ධතාවක් ගොඩ නගා ගැනීම කෙරෙහි යොමුවීමට ඉවහල් වන්නකි. ක්ෂුද්‍ර මට්ටමේ දී ගැටුම ගොඩ නැංවෙන පිටස්තරබව පිළිබඳ අදහස්වලට අභියෝග කිරීමට එය උපකාරී වන අතර, නොනැසී ඉතිරි ව සිටින්නන්ට එක් වී තම ජීවිත යළි ගොඩ නගා ගැනීම පිණිස ප්‍රජාවන් තුළ සාමූහිකත්වය පිළිබඳ හැඟීමක් ජනිත කරලීමට ද එය උපකාරී වන්නේය.

**ඉහළ මට්ටමේ සමාජ - ආර්ථික තත්වය**

මෙම ගණයට අයත් ගෘහවාසීන් සතුව ස්ථිර ආදායම් මාර්ග එකකට වඩා වැඩි සංඛ්‍යාවක් ද, මීට ඉහතින් දක්වූ ගණ දෙකට වඩා හොඳ වත්කම් ද තිබේ. මෙම ගණයට වැටෙන ඇතැම් අය යුක්තිය සම්බන්ධයෙන් ප්‍රජාමූලක විසඳුම් පිළිබඳ ව දරන්නේ වෙනස් ආකාරයක අදහස්ය.

> *"මෙම ප්‍රජාව අතර වසන පිරිස උගත්තු නොවේ. ඔවුන් අහිංසක අය. ඔවුන් තම ගැටළු බැරෑරුම් බවට පත් කර ගන්නෙ නෑ. ඔවුන් සැමවිට ම උත්සාහ දරන්නේ ඒවා තම තමන් අතර ම විසඳා ගැනීමට යි. අපිත් ඒ ක්‍රමයට පුරුදු වෙලා ඉන්නවා. ජනයා ප්‍රශ්නයක් තමන්ගෙ ප්‍රජාවගෙන් පිටතට රැගෙන ගියොත් ඒකෙන් පවුලට වගේ ම ප්‍රජාවටත් නරක නාමයක් ඇති වෙනවා. අපි අපේ ප්‍රශ්න පල්ලියෙ පියතුමා ළඟට අරන් යනවා. රායප්පු ජෝසප් පියතුමාට මේ දිස්ත්‍රික්කයේ හොඳ ගෞරවයක් තියෙනවා. අපේ සේරම පියතුමන්ලා කටයුතු කරන්නෙ එතුමාගෙ මග පෙන්වීම අනුවයි. මම හිතනවා ඒක අපිට තියන විකල්පයක් කියලා. අපේ සමහර ප්‍රශ්න පවුලෙ රහස් නිසයි ඒ. අපිට ඒ ප්‍රශ්න උසාවියකටවත් වෙන කොහාටවත් ගෙනි යන්න බෑ. යම් විදිහකින් එහෙම කළොත් ඔබට ඔබේ පවුල ගැන නරක නමක් අහන්න වෙන ගැටළුවට මූණ දෙන්න සිද්ධ වෙනවා. උදාහරණයකට, අපි සැමියා සහ බිරිඳ අතරෙ ඇති වන ප්‍රශ්නයක් පියතුමා ළඟට අරන් ගියා කියමු. ඔහු අපිට පවුල් උපදෙස් සපයනවා. ඒක උසාවියකට ගෙන ගියොත් පිටස්තර ලෝකයා දැන ගන්නවා.*
>
> *උගත් තැනැත්තාටත්, නූගත් තැනැත්තාටත්, පෝසතාටත්, දුප්පතාටත්, හැදියාවක් තියන මිනිහාටත්, හැදියාවක් නැති මිනිහාටත් යුක්තිය කියන දෙයින් අදහස් වන්නෙ එකිනෙකට වෙනස් දේවල්."*
> *(KRI F. 51)*

මෙම වෙනස් ආකාරයේ යථාදෘෂ්ටියෙන් හුවා දක්වෙන්නේ තම ගැටළු පිළිබඳ ව ස්වකීය ප්‍රජාව තුළ ම කටයුතු කිරීමට ප්‍රජාව දක්වන වැඩි මනාපයයි. මෙම කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රජාවන් විසින් තෝරා ගනු ලැබූ ක්‍රමයන් පිළිබඳ ව දෙන ලද වෙනත් ඇතැම් ප්‍රතිචාරයන්ට ප්‍රතිවිරුද්ධ අදහසක් මින් පළ කෙරෙන අතර, මෙය නියමාකාර තේරීමක් විය නොහැකි මෙන් ම, විකල්පයන් දෙකක් සැලකීමට ලක් කෙරෙන ක්‍රියාවලියක් නොව අවස්ථාවට ඉතා හොඳින් ගැළපේ යැයි දක්නට ඇති දෙය හුදෙක් අනුගත කර ගැනීමකැයි යන කරුණ හුවා දක්වන්නයි. ප්‍රජාව මත පදනම් වූ සහ ආගමික භක්තිය මත පදනම් වූ ක්‍රමයන් උපයෝගී කර ගැනීම කෙරෙහි ජනයා මනාපයක් දක්වන්නේ හුදෙක් ඔවුන් සතුව වෙනත් මාර්ග උපයෝගී කර ගැනීම සඳහා ප්‍රමාණවත් අධ්‍යාපන ක්‍රමයක් නොමැති නිසා ද යන ප්‍රශ්නය ඉන් පැන නගී. යුක්තිය සොයා යෑමේ දී වඩාත් දිළිඳු ජනතාවට තම ව්‍යුහයන්ට පරිබාහිර ව වෙනත් සමාජ ජාල නොතිබෙන බව ද ඉන් අනාවරණය වේ.

රාජ්‍ය මැදිහත්වීම්වලට සහ ආරවුල් නිරාකරණය කිරීම්වලට අදාළ ක්‍රමයන්ට පිවිසීමට ජනයා තුළ ඇති නොකැමැත්තට තුඩු දුන් සමාජ සාධක ද එමගින් පැහැදිලි වේ. අවශ්‍යයෙන් ම පෞද්ගලික දේවල් වන තම ගැටළු සියලු දෙනා අතර ප්‍රසිද්ධියට පත්වීම කෙරෙහි මැලිබවක් දක්වීම යුක්තිය පිළිබඳ ප්‍රජාමූලක පද්ධති පහළවීමට සහ ඒවා අඛණ්ඩ ව භාවිතයට යොදා ගැනීමට තුඩු දුන්නා විය හැක.

අයුක්තිය සම්බන්ධයෙන් පවුලේ තත්වය වැදගත් වන බවට මෙම කණ්ඩායම කරන සිත්ගන්නාසුලු අදහසක් මෙම උද්ධෘතයෙහි ගැබ්වේ. අනෙකුත් සමාජ - ආර්ථික කණ්ඩායම් 'අපරාධය' තමාට පෞද්ගලික වශයෙන් සහ පවුලේ කණ්ඩායම්වලට පරිබාහිර දෙයක් ලෙස දුටුව ද, සමාජ - ආර්ථික තත්වය අතින් ඉහළ මට්ටමේ ජනයා එය දක ඇත්තේ ඊට වෙනස් ආකාරයකටය. එබැවින් යුක්තිය පිළිබඳ තමන්ට ගැළපෙන යාන්ත්‍රණයන් සොයා යැමේ දී ඔවුන් විසින් වැදගත් සාධකයක් ලෙස සලකනු ලැබ ඇත්තේ තම තත්වය පවත්වා ගෙන යැමයි.

අධ්‍යාපනයෙහි සහ 'සංස්කෘතියෙහි' ඇති වැදගත්කම පිළිබඳ ව නැවත සඳහන් කරන හෙයින් සහ එය 'යුක්තිය' පිළිබඳ අදහස්වලට බලපාන්නේ කෙසේදැයි දක්වන හෙයින් උද්ධෘතයේ අවසන් කොටස වැදගත් වේ. සංස්කෘතිය යන්නෙන් නිරාවරණය වීම, තම ප්‍රජාවෙන් පරිබාහිර දේවල් ගැන දැනුවත් ව සිටීම, සමාජ ප්‍රතිමානයන් හා අවස්ථා පිළිබඳ දැනුම අදහස් කෙරෙන බව සැලකිය හැක. එසේ ම ඇතැම් සම්මුතිගත සමාජ ප්‍රතිමානයන් සහ ජනයා ඒවා කෙරෙහි බැඳී සිටින මට්ටම් ඉන් අදහස් කෙරෙන බව ද සැලකිය හැක. සංස්කෘතිය යන්න මෙහිලා යොදා ගෙන ඇත්තේ සමාජ විෂමතාවන් ඇති කරලීමට සහ යුක්තිය අවබෝධ කර ගැනීමට අනුරූප වනු ඇතැයි පැවසෙන ධුරාවලියක් හඳුන්වා දීම පිණිසය. ඉහළ සමාජ - ආර්ථික තත්වයේ ගණයට වැටෙන ප්‍රජාවක සාමාජිකාවක විසින් ප්‍රජාව තුළ තමන්ට ඇති ස්ථානය දක්වීමට වෙසෙසින් උත්සාහ දරා ඇති අතර, සමාජ ස්තරායනය පිළිබඳ පැහැදිලි හැඟීමක් ද ඉන් ඉදිරිපත් කෙරේ.

මෙම ප්‍රජාවන්හි ජනයා යම් හෙයකින් සෙසු බාහිර සමාජයන්ට වඩාත් නිරාවරණය වී තිබුණා නම්, ඔවුන් ඊට වඩා වෙනස් ආකාරයේ තෝරා ගැනීමක් සිදු කර, යුක්තිය සහ සහනය පිළිබඳ වෙනත් ආකාරවල මාර්ග සොයා බලනු ඇතැයි යන අදහස ඉන් ඉදිරිපත් වේ. මෙම නව යථාදෘෂ්ටිය අනුව තමන් පසු වන අවස්ථාවන් පිළිබඳ ව නැවත විමසා බලා, තමන් අත්දුටු දේවල් පිළිබඳ ව යුක්තිය ඉෂ්ට කරවා ගැනීමට ප්‍රජාව විසින් තැත් කිරීමට ඉඩ ඇත. ප්‍රජාවගේ අධ්‍යාපන මට්ටම් ඔවුන්ගේ ජාල මඟින් හැඩ ගස්වනු ලැබ, ඔවුන් ගරු කරන ව්‍යුහයන් මත පදනම් ව තිබෙන අතර, ඔවුන් ස්වෝත්සාහයෙන් ම යථා තත්වයට පත් වීමේ ක්‍රියාවලියෙහි නිරත ව සිටීම වැදගත් කරුණකි.

මෙම උද්ධෘතයේ කැපී පෙනෙන කරුණ වන්නේ අදහස් දැක්වීමේ දී තමා ද ඊට ඇතුළත් කර ගැනීමය ("අපිත් ඒ ක්‍රමයට පුරුදු වෙලා ඉන්නවා"). මෙය වැදගත් වන්නේ ප්‍රජාව විසින් එක්තරා විශේෂ ආකාරයක මැදිහත් වීමේ ක්‍රමයන් තෝරා ගැනීම පිළිබඳ ව ඇති ඇතැම් වඩාත් තීරණාත්මක අංග කිහිපයක් හඳුනා ගැනීමට ඇය සමත් ව සිටින අතර ම, එය ප්‍රජාවන්ගේ ම කොටසක් වශයෙන් තමා ද එය තෝරාගත් බව ඇය පිළිගෙන තිබීම නිසාය. තම ප්‍රජාව සඳහා හොඳම විකල්පය වන්නේ මෙය බව තවමත් සිතන පුද්ගලයෙකු වෙතින් පළ වූ එම ප්‍රකාශයෙන් පිළිබිඹු කෙරෙන්නේ අගනා තීරණාත්මක සිතිවිල්ලකි. මෙම අධ්‍යයනයේ අරමුණ පිළිබඳ ව සලකන කල ප්‍රජාමූලක ක්‍රමය පිළිබඳ න්‍යායාත්මක උපදේශයක් පමණක් විය හැකි වීමට තිබූ ඉඩකඩ සමතෝලනය කිරීමට එය උපකාරී වේ.

මෙම ගණයේ සෙසු පුද්ගලයන්ගෙන් ලද සහතික කිරීම් ද අනෙකුත් ප්‍රජාවන්හි සාමාජිකයන් විසින් පළ කරන ලද මතයන් ම ප්‍රතිරාව කරයි. KRI ප්‍රතිචාරකයන් විසින් පූජකවරයන් සහ මැදිහත්වීමේ ක්‍රියාවලියට ඔවුන් සම්බන්ධ වී සිටීම ගැන සඳහන් කරන අතර NNT ප්‍රතිචාරකයෝ පූජකවරයන්ගේ සහ ග්‍රාම නිලධාරීන්ගේ භූමිකා පිළිබඳ ව සඳහන් කරති.

> *"යුක්තිය රටේ සැම දෙනාට ම එක සමාන වන්න ඕන. අපි ජාතිය, කුලය, ආගම ගැන සලකන්න හොඳ නෑ. අපි සුවාමි ළඟට යන්නෙ යුක්තිය පතා ගෙන. ඒ අය අපේ ප්‍රශ්න විසඳනවා."*
> *(KRI M.55)*

> *"යුක්තිය ගැන කතා කරන කොට අපිට බැරෑරුම් ප්‍රශ්නෙකට මූණ පාන්න වෙන්නෙ නෑ. මොනවා හරි ප්‍රශ්නයක් තිබුණොත් ඒක ග්‍රාමසේවක විසඳා දෙනවා. මේ සාකච්ඡාවලට සුවාමිලත් හවුල් වෙනවා."*
> *(NNT F.44)*

### මුල්ම නිගමනයන්

ගැටුමට මැදි වූ ප්‍රජාවන් යුක්තිය සමාජ - ආර්ථික තත්වය සමඟ එකට බැඳී ඇති දෙයක් ලෙස දකින නමුදු, ඔවුන් යුක්තිය සහ තම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා එයට මැදිහත්වීම් සොයා යන ආකාරය ඇත්ත වශයෙන් බලන විට ඔවුන්ගේ තත්වය සමඟ විශාල වශයෙන් ඇඳී නැති බැව් පර්යේෂණයේ දී අනාවරණය විය. යුක්තිය පිළිබඳ ක්‍රමයන් තෝරා ගැනීම වැඩි වශයෙන් බැඳී ඇත්තේ ප්‍රජාවන්ගේ සාමූහික අත්දැකීම්, අනන්‍යතාව සහ ඔවුන් දන්නා හා ගරු කරන ව්‍යුහයන් සහ ආයතන සමඟ ය.

ධනය, සමාජ ජාල සහ තත්වය යන කරුණු යුක්තියට සහ යුක්තිය පිළිබඳ විධිමත් යාන්ත්‍රණයන්ට පිවිසීම කෙරෙහි කෙසේ බලපාන්නේදැයි ප්‍රජාවන්ගෙන් කළ විමසීමට ඔවුන්ගෙන් ලද පිළිතුරු මඟින් පළ වූයේ ධනවත් සහ මනා සම්බන්ධතා ඇති පුද්ගලයන්ට උසාවි ක්‍රමයට පිවිසීමටත්, පොලීසියට කරුණු ඉදිරිපත් කිරීමටත් හැකි බවය.

එසේ වුව ද, මෙම මතයට පිටුපා යමින්, ධනවත් අය ඇතුළුව සියලු දෙනා ම පෙන්නුම් කළේ යුක්තිය පිළිබඳ විධිමත් ක්‍රමයේ පිළිසරණ පැතීමට තමන්ට අවශ්‍ය නොවන බවය. ස්වකීය ප්‍රජාවන් විසඳුම් සෙවීමට පුරුදුව සිටින ක්‍රමය දිගටම පවත්වා ගෙන යෑමෙන් ඔව්හු සෑහීමට පත්ව සිටියහ.

ගැටුමේ ප්‍රධාන භූමිකාවකට සම්බන්ධ ශ්‍රී ලංකා රජය යටතේ ක්‍රියාත්මක වන යුක්තිය පිළිබඳ විධිමත් ක්‍රමයේ පිළිසරණ පැතීම ගැටුමින් හානියට පත් මෙම ප්‍රජාවන්ට හොඳ ම ක්‍රමය ලෙස පෙනී නොගියා විය හැක.

සම්මුඛ සාකච්ඡාවල උද්ධෘත මඟින් පෙන්වා දෙන්නේ ගැටුමින් හානියට පත් ප්‍රජාව තමනට යුක්තිය පසිඳලීම සඳහා විධිමත් නෛතික ක්‍රියාවලියන් තිබිය යුතුයැයි අවශ්‍යයෙන් ම නොසිතන නමුදු, වඩාත් ප්‍රජාමූලක ආයතන කෙරෙහි යොමු කළ හැකි අන්දමේ ගැටළු රැසක් තමන් වෙත තිබේයැයි ඔවුන් සලකන බවකි.

## 7. සහසම්බන්ධතාව කෙරෙහි නැවත යොමු වීම

### යුක්තිය පිළිබඳ නිර්වචනය

මෙම අධ්‍යයනයෙහි දී යුක්තිය පිළිබඳ නිර්වචනය භාවිත කර ඇති ආකාරය අනුව එය සලකා ඇත්තේ අඛණ්ඩ ක්‍රියාවලියක් වශයෙන් වන අතර, එක් එක් ප්‍රජාවකින් ලබාගත් තොරතුරුවලින් හෙළි වන්නේ එම ක්‍රියාවලිය ප්‍රජාව විසින් අත්විඳින ලද අයුක්තීන්ට අදාළ ව කෙතරම් දුරට සාර්ථක වී ඇත් ද යන්නය. යුක්තිය යනු ප්‍රජාවන්ට තම ජීවිතයට අනුගත කරගත හැකි සාධාරණ දෙයකැයි යන අදහස ඇඳී තිබෙන්නේ තමන් ලද අසාධාරණ අත්දැකීම් පිළිබඳ ව ප්‍රජාව තුළ පවත්නා විශ්වාසය සමඟ වන අතර යුක්තියට අදාළ විධිමත් නෛතික යාන්ත්‍රණයන් මඟින් ඉටු කෙරෙන යුක්තිය පිළිබඳ අදහසින් එය බොහෝදුරට වෙනස් වූවකි. නිදසුනක් වශයෙන්, ගැටුම පිළිබඳ තම අත්දැකීම් තමන්ට එරෙහිව සිදු කරන ලද අපරාධ වශයෙන් ඇතැම් ප්‍රතිචාරකයන් විසින් සැලකුව ද, ඔවුන් එය විඳ දරා ගනිමින් සිය කටයුතු කරගෙන ගොස් ඇති අතර, දන් ඔවුන් තම අවධානය යොමු කර ඇත්තේ වත්මනේ තමන් මුහුණ පාන ගැටළු කෙරෙහි පමණක් බැව් පර්යේෂණයෙන් හෙළිවේ.

මෙය සලකා බැලිය යුතු වන්නේ ප්‍රජාවන් මුහුණ පෑ සීමිතභාවයන් හා ව්‍යුහාත්මක සීමාබන්ධනත්, ඔවුන් පැතූ යුක්තිය පිළිබඳ ආකාරය කෙරෙහි එය බලපා ඇත්තේ කෙසේ ද යන්නත් පිළිබඳ සහසම්බන්ධතාව තුළය. මෙම පර්යේෂණයේ ඉලක්කය වූයේ ප්‍රජාවන් විසින් යුක්තිය සොයා යෑමේ දී ඔවුන්ගේ සමාජ - ආර්ථික තත්වය, බලපෑම පිළිබඳ වැදගත් සාධකයක් වූයේ කෙසේ ද හා කිනම් විට දී ද යන්න පරීක්ෂා කර බැලීමය. එසේ වුව ද, අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රජාව පසු වූ අවස්ථාවන් පිළිබඳ සංකීර්ණ යථාර්ථ තත්වය ග්‍රහණය කර ගැනීමට මෙම උපකල්පනය සමත් වී නැති බැව් ක්ෂේත්‍ර පර්යේෂණයේ දී පෙනී ගියේය. පර්යේෂණයේ දී අනාවරණය වූයේ විවිධ සමාජ - ආර්ථික මට්ටම්වලින් යුත් ගෘහවාසයන් පරාසයක් සෑම ප්‍රජාවක් අතර ම වාසය කළ බවය. මෙම හේතුව නිසා වෙන වෙන ම ගණ තුනකට බෙදා දක්වීම ඉතා කෘත්‍රිම ආකාරයේ විභජනය කිරීමක් බව පෙනී ගියේය. පරීක්ෂණය මඟින් ඉදිරිපත් කළ හැකි කරුණ වන්නේ සමාජ - ආර්ථික තත්වයන් පිළිබඳ පරාසය සහ ගැටුමෙන් හානියට පත්වීම පසෙක තිබිය දී, ප්‍රජාවන් වැඩි මනාපයක් දක්වන ලද බව පෙනී ගියේ ගැටුමට අදාළ තම ගැටළු, යථා තත්වයට පත්වීම පිළිබඳ පුළුල් සහසම්බන්ධතාව තුළ තමන්ට විශ්වාසය තැබිය හැකි ස්වකීය යාන්ත්‍රණයන් මඟින් ම විසඳා ගැනීම කෙරෙහි බවය. ගැටුමින් හානියට පත් ඇතැම් ජනයා සමාජ - ආර්ථික තත්වය බලපෑම් කිරීමේ සාධකයක් ලෙස සංජානනය කිරීමට ඉඩ තිබෙන නමුදු, ප්‍රායෝගික වශයෙන් සලකන

කල පෙනී ගියේ, ප්‍රජාව සමඟ පවත්වන සම්බන්ධකම්, විශ්වාසය සහ පිළිගැනීම පිළිබඳ මට්ටම්, සදාචාරාත්මක හා සමාජ ආකල්ප කෙරෙහි දක්වන අනුකූලතාව සහ සිරිත්විරිත් වැනි අනෙකුත් කරුණු තම ප්‍රජා ගැටළු විසඳා ගැනීමට උපකාරී වන යාන්ත්‍රණයන් සහ ආයතන තෝරා ගැනීම සම්බන්ධයෙන් වඩාත් කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කර ඇති බවය. ඉහළ මට්ටමේ සමාජ - ආර්ථික තත්වයන් යුතුව පසුවන අය ද වැඩි කැමැත්තක් පළ කළේ මැදිහත්වීම පිළිබඳ ප්‍රජා - කේන්ද්‍රීය විකල්පයක් තෝරා ගැනීම කෙරෙහිය. ජනයාගේ අත්දැකීම් තරමක් එක හා සමාන වූ නිසා ද, සෑම දෙනාට ම තමන්ගේ අය සහ දේපළ අහිමිව සිටි හෙයින් ද, ගැටුම අත්විඳි ආකාරය සම්බන්ධයෙන් විමසන කල්හි ද සමාජ - ආර්ථික තත්වය වැදගත් සාධකයක් නොවේ. එබැවින් පර්යේෂණය මඟින් නිගමනය කළ හැක්කේ සමාජ - ආර්ථික තත්වය ආරම්භක අයුක්තීන්ට හෝ ඉන් අනතුරුව යුක්තිය සොයා යෑමට සැලකිය යුතු අන්දමේ බලපෑමක් සිදු කර නොමැති බවය.

**සාමය පිළිබඳ නිර්වචනයන්**

සෘණාත්මක සාමයේ සිට ධනාත්මක සාමය කරා සංක්‍රාන්ත වීම පිළිබඳ මතය ද පර්යේෂණය මඟින් අභියෝගයට ලක් කෙරේ. ලංකාණ්ඩුව සහ එල්.ටී.ටී.ඊය අතර ඇති කර ගන්නා ලද සටන්විරාම ගිවිසුම මඟින් ධනාත්මක සාමයක් උදා නොවන අතර, මහා මට්ටමේ දී දේශපාලන ස්ථාවරත්වය තහවුරු කරලීම පිණිස කර ඇති දේ අල්පය. වඩාත් සාධාරණ සමාජ සම්බන්ධතාවක් දෙසට ඇදී යෑමක් සිදු වී නොමැති අතර ගැටුමට තුඩු දුන් ගැටළු විසඳීමට කටයුතු කර ඇත්තේ ද නැත. ආතති ඉහළ යමින් ද, ප්‍රචණ්ඩත්වය නැවත නැවතත් තර්ජනය කරමින් ද පවතින අතරවාරයේ දේශපාලන වශයෙන් වාසි ලබා ගැනීම උදෙසා දේශපාලන මතවාදවල එල්බ ගෙන සිටීම දිගින් දිගට ම සිදු වේ. එසේ වුව ද, පර්යේෂණයට දායක වූ හානියට පත් ප්‍රජාවෝ සටන් විරාම ගිවිසුම දිගට ම පවතිනු ඇතැයි යන අපේක්ෂාවෙන් හුදෙක් සෑහීමට පත්ව පසු වෙති. ඔවුන්ගේ අනාගත අභිලාෂයන් මෙම තත්වය මත අඛණ්ඩ ලෙස රැඳී පැවතෙමින් තිබී කලක දී වඩාත් ස්ථාවර එකක් බවට පත් වනු ඇත.

> *"මට මගෙ ඉගෙනීම අවසන් කරලා රැකියාවක් හොයා ගන්න ඕන. මගෙ අම්මා, සහෝදරයා, සහෝදරී බලා ගන්න එක තමා මගෙ යුතුකම. අපිට අපේම කියලා ගෙයක් හදා ගන්න ඕන. මගෙ අම්මා රස්සාව කරන තැනින් ගත්ත ණය තාමත් ගෙවමිනුයි ඉන්නෙ. අපි හිටිය තැන් යුද හමුදාවෙන් අල්ලා ගත්තා. අපි ආපහු යන්න කැමතියි. මේ සාමකාමී තත්වය දිගට ම පැවතුනොත් අපිට ඒ ගැන යන්තමට හිතන්න පුලුවන්."*
> *(KRI F 17)*

> *"අපිට කාගෙන්වත් මුකුත් ඕනෙ නෑ. සාමය පැවතුනොත් අපිට අපේ වැඩ දිගට ම කර ගෙන යන්න පුලුවන්, අපේ ළමයින්ට ඒ අයගෙ ඉගෙනීමත්, රස්සාවලුත් දිගට ම කර ගෙන යන්න පුලුවන්. අපිට අපේ පාඩුවේ ජීවිතය ගෙනි යන්නයි ඕනෙ. (පවුලක් හැටියට) අපි අපේ හයිය ගැන විස්වාසයක් අපිට තියනවා. මේ සාමකාමී තත්වය දිගට ම පැවතුනොත්, අපිට බලාපොරොත්තු තියා ගන්න පුලුවන්."*
> *(KRI F.51)*

> *"අපේ ළමයි ඉස්කෝලෙ යනවා. අපේ කාලෙ වගේ නෙමේ. ළමයි ඉස්කෝලෙ යවන්න හුඟක් සල්ලි ඕන වෙනවා. අපි හොඳ අධ්‍යාපනයක් දුන්නොත්, ඒ අයට දුක් විඳින්න වෙන්නෙ නෑ. ඔවුන්ට හොඳ රස්සාවල් ලැබෙනවා. ඒකට අපිට සල්ලි ඕන. අපි මේ ගේ ලස්සණට හදා ගන්න කැමතියි. මේ සමාදානය දිගට ම පවතීවිද කියන්න මම දන්නෙ නෑ. එහෙම වුනොත් නම් හොඳයි."*
> *(MSL F. 26)*

> *"අපිට ඕනෙ සාමයෙන් ජීවත් වෙන්නයි. සාමය පැවතුනොත් අපිට ප්‍රශ්න ඇත්තෙ නෑ."*
> *(NNT M 54)*

පවත්නා තත්වය හානියට පත් සියලු ම ප්‍රජාවන් විසින් තම වත්මන් අවශ්‍යතාවන් සඳහා ප්‍රමාණවත් වන සාධකයක් ලෙසින් දකිනු ලැබීම සැලකිය යුත්තකි. දනට බලපවත්නා බිඳෙනසුලු සාමය පදනම් කර ගෙන ඔව්හු තම අනාගතය පිළිබඳ ව බලාපොරොත්තු රඳවා සිටිති. ඔවුන් පළ කළ සියලු අනාගත අභිලාෂයන් තුළ සමාජ - ආර්ථික මානයන් ගැබ් ව තිබුණ ද, ඒවා මුල් බැස තිබුණේ අඛණ්ඩව පවත්නා සාමය පිළිබඳ තැබූ විශ්වාසය මතය.

අදාළ ප්‍රජාවන්ට තම අනාගතය දිගට ම ගොඩ නගාගෙන යෑම පිණිස සෘණාත්මක සාමයක් වුව ද, ප්‍රමාණවත් තරමේ ධනාත්මක එකක් වන අතර, වඩාත් පුළුල් දේශපාලන කරුණු මෙම ප්‍රජාවන්ට වඩා ඇත්ත වශයෙන් ම අදාළ ව තිබුණේ පරිබාහිර පක්ෂවලට බැව් මින් අනාවරණය වේ.

**මානව සුරක්ෂිතභාවය**

මානව සුරක්ෂිතභාවය පිළිබඳ සංකල්පය සහ පශ්චාත් සට්ඨන පරිසරයන්ට එහි ඇති ප්‍රයෝජනවත් බව ද පර්යේෂණයේ අභියෝගයට ලක් වේ. මන්නාරම් දිස්ත්‍රික්කය ගැටුමින් විශාල වශයෙන් හානියට පත් ව තිබූ අතර, 'බොහෝ කල් පැවති තර්ජනයන්ට' සහ 'දෛනික ජීවිතයේ හදිසි හිංසාකාරී බිඳ වැටීම්වලට' ලක් ව තිබූ හෙයින් ප්‍රජාවන් පසු වූයේ බොහෝ දුරට අනාරක්ෂිතවය. යුද්ධයේ ගොදුරු බවට පත් වූ මොවුන් කෙරේ මෙතරම් අල්ප අවධානයක් දැක්වූයේ මන්දයි මානව සුරක්ෂිතභාවය පිළිබඳ සංකල්පයට පැහැදිලි කළ හැකි වන්නේ ද? මෙහෙයුම් සිදු කරන ආයතන සහ පළාත් පාලන ආයතන එම සංකල්පය පිළිබඳ ව මීට වඩා දැනුවත්ව පසු වූයේ නම්, එවිට අධ්‍යයනයට පාත්‍ර වූ ජනයා උදෙසා ගැටුමෙන් අනතුරුව සිදු කෙරෙන සංවර්ධනය සහ යථා තත්වයට පැමිණීම පිළිබඳ අත්දැකීම් ඊට වඩා වෙනස් මගක් ගත හැකිව තිබුණේයැයි තර්ක කිරීම වලංගු වන්නේ ද? එබඳු පුළුල් සහ සියල්ල ආවරණය කෙරෙන සංකල්පයක් එයට අදාළ නොවන සමාජ හරයන්ට සහ සමාජ - ආර්ථික තත්වයන් පිළිබඳ තවත් පිරික්සුම් රාමුවක් තුළට රිංගවීමේ අනුචිත හා කාලෝචිත නොවන අනතුරක් පවතී.

මානව සුරක්ෂිතභාවය පිළිබඳ සංකල්පයට පශ්චාත් - සට්ඨන තත්ත්වයන් පිළිබඳ කිසියම් අදාළත්වයක් තිබීමට නම්, ප්‍රජාවන්ට බල පෑ ගැටුම් පිළිබඳ සිදුවීම්වලින් අනතුරු ව පැවති තීරණාත්මක කාලසීමාවේ දී එය භාවිතයට යොදාගත යුතුව තිබිණ. එය ප්‍රාදේශීය මට්ටමේ දී අර්ථාන්විත වීමට නම්, එය ක්‍රියාවට නැගිය යුතුව තිබුණේ ප්‍රජාවන් ඉතාමත් ම අනාරක්ෂිත ව පසු වූ කාලයේ දී මිස ඔවුන් තම සුරක්ෂිතභාවය ප්‍රතිෂ්ඨාපිත කරගත් පසු ඔවුන් පිළිබඳ අධ්‍යයනයන් සිදු කිරීමේ ක්‍රමයක් වශයෙන් නොවේ.

මන්නාරම් දිස්ත්‍රික්කය සහ පර්යේෂණයට දායක වූ ප්‍රජා කණ්ඩායම් තුන සැලකිය හැක්කේ සංක්‍රාන්ත වෙමින් පවත්නා සමාජයන් ලෙසිනි. සාමය කරා නියම සංක්‍රාන්තවීමක් සිදුවීමෙහි ලා පූර්වඅවශ්‍යතාවක් වන දේශපාලන ස්ථාවරත්වය ඇති කර නොතිබුණ ද, ඔව්හු ගැටුමින් බරපතළ ලෙස හානියට පත් වූ තත්ත්වයේ සිට තිරසර හා පිළිගත හැකි සාමයක් කරා යන දිගු ගමනට අවතීර්ණව සිටිති. තමන් අතර පවත්නා ආරවුල් විසඳීම සහ මැදිහත් වීම පිණිස ප්‍රජාවන් විසින් අනුගත කරගෙන තිබෙන විසඳුම් මඟින් අනාවරණය වන්නේ මෙම ප්‍රජාවන් අතර ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මකව පවත්නා බවය. තොම්සන් - සේනානායක මෙසේ පළ කරයි :

> *"සංක්‍රාන්ත යුක්තිය පිළිබඳ සහසම්බන්ධතාවෙහි ලා සලකන කල සන්ධානය සහ සක්‍රීය ප්‍රජාතාන්ත්‍රික සමාජයක් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා සියලු අංශවල මානව සුරක්ෂිතභාවය පුනස්ථාපනය කිරීම අවශ්‍ය කෙරේ. අධිකතර අභ්‍යන්තරික ගැටුම හෝ මර්ධනය පිළිබඳ කාලපරිච්ඡේදයන්ගෙන් විමුක්ත වීමට උත්සාහ දරන සමාජයන්හි දේශපාලන, පෞද්ගලික සහ ප්‍රජා සුරක්ෂිතභාවයන් වැනි මානව සුරක්ෂිතභාවයට අයත් විවිධ අංග වඩාත් තීව්‍ර කරන ලද වැදගත්භාවයකට පත් වේ. එතකුදු වුවත්, කෙනෙකුට ලෝකයේ හිමි තැන පුනස්ථාපනය කිරීමට ඔහුගේ දෛනික මානව අවශ්‍යතාවන් සහතික කෙරෙන ආර්ථික, ආහාර සහ සුරක්ෂිතභාවය ද සපිරී තිබිය යුතු වේ."*
>
> *(Thomson - Senanayake - 2002" p.10)*

මෙම අදහස්වලට අනුකූල වන ආකාරයේ සහසම්බන්ධතාවන් ඇති කරලීමට පර්යේෂණය උපකාරී වේ. සංක්‍රාන්ත යුක්තිය පිළිබඳ සහසම්බන්ධතාව ගැන සලකල කල මානව සුරක්ෂිතභාවය ළඟා කර ගැනීමට අදාළ සියලුම අංශ පුනස්ථාපනයට පත් කළ යුතු බවට පර්යේෂණය එකඟ වේ. එනමුදු ඉන් විදහා දක්වෙන්නේ සංක්‍රාන්ත යුක්තිය සහ යථා තත්වයට පත් වීම ඇරඹෙන්නේ ගැටුම අවසන් වීමත් සමඟ බවය. ප්‍රජාවෝ මෙම සංක්‍රාන්ත අවධිය ඇරඹීමට පිළිගත හැකි දේශපාලන විසඳුමක් එළඹෙන තුරු බලා නොසිටිති. සංක්‍රාන්ත යුක්තිය යන පදයෙන් යුද්ධයෙන් හානියට පත් සමාජයේ සිට සාමයට ඉඩ සැලසී තිබෙන සමාජයක් දක්වා සංක්‍රාන්ත වීම හැඟවෙන අතර, මෙම පර්යේෂණයෙන් යෝජනා කෙරෙන්නේ ඇතැම් විට පූර්ව-සංක්‍රාන්ත අවධිය පවා වැදගත් වූවක් ලෙස සැලකිය යුතු බවය. සංක්‍රාන්තය සඳහා යම් ආකාරයක දේශපාලන ස්ථාවරත්වයක් අවශ්‍ය කරන නමුදු, මෙම ස්ථාවරත්වය ඇති කරලීමට පෙරාතුව යථා තත්ත්වයට පත්වීමට අදාළ පූර්ව-සංක්‍රාන්ත ක්‍රියා බොහොමයක් සිදු වේ. පැතිකඩවල් පිළිබඳ ලක්ෂණ ගෙන හැර දක්වන ලද මෙම ප්‍රජා කණ්ඩායම් තුන ලෝකයෙහි තමනට හිමි ස්ථානයට යළි

පත්වීමට කටයුතු කරන අතර ම, සටන් විරාමය පිළිබඳ තත්වයෙහි බිඳෙනසුලු බව නොතකා තම ආර්ථිකය ආහාර, සෞඛ්‍යය, ජීවිකා වෘත්තීන් සහ සුරක්ෂිතභාවය යන කරුණු පිළිබඳ අවශ්‍යතාවන් තහවුරු කර ගැනීමට ද කටයුතු කරති.

කෙසේ වුව ද, ඉදිරියට යෑමට නම් ගැටුමින් හානියට පත් ප්‍රජාවන්ට තම අතීතය සමඟ සන්ධානගත විය යුතුව ඇත යනුවෙන් තොම්සන් - සේනානායක පිළිබිඹු කරන්නේ ඊට වෙනස් මතයකි.

> *"සන්ධානගත වීම යන්නට අතීතය පිළිබඳ අවධානයන් සහ එම අවධානයන් අනාගතය පිළිබඳ අවධානයන්ට හා අපේක්ෂාවන්ට අවියෝජනීය ලෙස සම්බන්ධ ව තිබෙන බව පිළිගැනීම ඇතුළත් සංක්‍රාන්ත යුක්තිය පිළිබඳ ක්‍රියාවලියේ එක් මොහොතක් ඇතුළත් ය."*
> *(Thomson - Senanayake 2002 : P.11)*

සන්ධානගත වීම පිළිබඳ මතය පූර්ව-සංක්‍රාන්ත අවධිය කෙතරම් වැදගත් වන්නේදැයි දක්වෙන මෙම පර්යේෂණයේ සොයා ගැනීම සමඟ සැසඳෙන්නේ නැත. පර්යේෂණයට සම්බන්ධ කටයුතුවලදී ප්‍රජාවන්ට සහ ජනයාට පෙනී ගියේ අතීතය පිළිබඳ අවධානයන් අනාගතය පිළිබඳ අවධානයන් සමඟ ඇඳී නොමැති බවය. ඔවුන් මෙම අවධානයන් පිළිගෙන තිබූ මට්ටම අවම වූවක් වන අතර, තම අතීතයෙන් මිදී ඉදිරියට ගමන් කර, අනාගතය දෙස බැලීමට ඔවුන්ට හැකියාවක් තිබේ. තොම්සන් - සේනානායක දක්වන සන්ධානගත වීමේ මොහොත කරා ඔවුන් දනටමත් ළඟා වී ඇත්තේ තම අතීතය සමඟ බැඳී ඇති සිදුවීම් පිළිගැනීමකින් හෝ තැකීමකින් තොරවය.

මෙම සාකච්ඡාවෙන් ප්‍රයත්න දරෙන්නේ සාමාන්‍යයෙන් පශ්චාත් - ගැටුම්කාරී තත්වයන්ට අදාළ වන සංකල්ප වත්මන් පර්යේෂණයට දායක වූ ප්‍රජාවන්ට විශේෂයෙන් ප්‍රයෝජනවත් හෝ අදාළ හෝ නොවන බව හුවා දක්වීමට ය. මෙම සංකල්ප මඟින් ප්‍රජාවන් ලද අත්දැකීම් ඒ ඒ ගණවලට බෙදා දක්වා, විවිධ ආයතනවල අසාර්ථකභාවය පෙළ ගස්වා, අනාගතය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට ගැටුම්කාරී පරිසරයෙන් පරිබාහිරව සිටින විශේෂඥයන්ට ඉඩ සැලසිය හැකි වන නමුදු භූමියෙහි පවත්නා තත්වය පිළිබඳ යථාර්ථයක් ඒවායින් පිළිබිඹු කෙරෙන්නේ නැත. මෙම පර්යේෂණය මඟින් ඉදිරිපත් කෙරෙන්නේ මානව සුරක්ෂිතභාවය සහ සන්ධානගත වීම පිළිබඳ සංකල්ප ගැන වඩාත් අවශ්‍ය කරන ආකාරයේ විචාරාත්මක ආවර්ජනයක් සිදු කර, මෙම ප්‍රදේශයේ ඉදිරි කටයුතු කරගෙන යෑමට අදාළ මූලික නිර්දේශ කිහිපයකි.

## 8. සාකච්ඡාව ඉදිරියට ගෙන යෑම

**ආරවුල් නිරාකරණය කිරීම සහ ප්‍රජාවන් යොදා ගන්නා ව්‍යුහයන් ශක්තිමත් කරන්න.**

ප්‍රජාවන්ගේ තෝරා ගැනීම් අනුව පෙනී ගියේ ඔවුන් විසින් භාවිතයට යොදා ගනු ලබන තම ප්‍රදේශයේ පිහිටි ආයතනවලට ඔවුන් ගරු කරන බවත්, ප්‍රජාවන් අතර ඒවට ඉහළ මට්ටමේ නිත්‍යානුකූලබවක් හා පිළිගැනීමක් තිබෙන බවත් ය. මෙම මුස්ලිම් පල්ලි කමිටුවලට, ග්‍රාම සංවර්ධන කමිටුවලට සහ පල්ලියේ කණ්ඩායම්වලට ඒවාට අවශ්‍ය ආධාර මධ්‍යම රජයෙන්, පළාත් පාලන ආයතනවලින් සහ රාජ්‍ය නොවන ආයතනවලින් ලැබිය යුතු වන්නේ ය. මෙම කණ්ඩායම් සහ පළාත්පාලන කාර්යාල අතර පවතින සම්බන්ධතාවන් වැඩිදියුණු කිරීම, ප්‍රජා රැස්වීම් පවත්වන ස්ථාන වැනි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ඔවුන් ඉල්ලා සිටින්නේ නම්, ආරවුල් විසඳීමේ ශිල්පීයක්‍රම හා බේරුම් කිරීමේ නිපුණතාවන් පිළිබඳ පුහුණුව හා තාක්ෂණය සැපයීම ආදී ස්වරූපයන්ගෙන් මෙය සිදු කළ හැක. එයට අමතර වශයෙන්, මෙම ආයතන සහ ඒවා හා සමාන අදහස් හා විධික්‍රම තිබෙන වෙනත් ඒවා අතර සම්බන්ධතා වර්ධනය කළ හැකි වන්නේය. මෙම කණ්ඩායම් විසින් ලබා ගන්නා දැනුම සහ නිපුණතාවන් එබඳු ආකාරයේ වෙනත් කණ්ඩායම් සහ සංවිධානවලට සම්ප්‍රේෂණය කිරීම වැදගත්ය. තොරතුරු පාලනය මෙම ආයතනවල දිශාවට පමණක් සිදු විය යුත්තක් නොව, මෙම ආයතනවලින් ප්‍රභව වී වෙනත් ආයතන කරා හා අතර ද ඒවා විහිද යා යුතු වන්නේ මෙම ප්‍රජා කණ්ඩායම්වල අත්දැකීම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමෙන් දැනුම් සම්භාරයක් අත් කරගත හැකි වන හෙයිනි.

### ගැටුමට ලක් වූ ප්‍රදේශයන්හි වඩාත් විධිමත් ආකාරයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න

පර්යේෂණයෙන් ඉස්මතු වන තවත් කරුණක් යොමු වන්නේ හානියට පත් ප්‍රදේශයන්හි පශ්චාත් යටිතල පහසුකම් සහ ජීවන වෘත්තීන් සංවර්ධනය නොවී පැවතීම පිළිබඳවය. ජීවිකා වෘත්තීන්ට ආධාර කරන ව්‍යාපෘති, ක්ෂුද්‍ර-ණය ආධාර යෝජනාක්‍රම සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන් මගින් අධ්‍යයනයට පාත්‍ර වූ සෑම ප්‍රජාවකට ම සෙත සැලසිය හැකි වන්නේය. නිදසුන් වශයෙන්, MSL ප්‍රදේශයේ ප්‍රජාවට ජලසම්පාදනය, නිවාස, ජලය හා සනීපාරක්ෂාව සහ සම්බන්ධතාවන් ගොඩ නැගීම යන දේවල් පිළිබඳ ව විශේෂ ආධාර අවශ්‍ය කෙරේ. ප්‍රමාද ව ඇති මෙම අවධියෙහි පවා මානව සුරක්ෂිතභාවය ඉහළ නැංවීමට නම්, මෙම ප්‍රජාවන්ට ආධාර කළ යුතු වන අතර, බාහිර කම්පනයට සහ සංවර්ධන අභියෝගයන්ට ගොදුරු වීමට ඇති ඉඩප්‍රස්තා අවම කිරීම අවශ්‍ය වන්නේය.

### ගැටුමින් හානියට පත් ප්‍රජාවන් ලත් පාඩම් සහ අත්දැකීම් බෙදාහදා ගන්න

පර්යේෂණයෙන් සිදු කෙරෙන්නේ හුදෙක් මෙම ප්‍රජාවන් තුළින් ලබාගත හැකි දැනුමෙහි මතුපිටින් තිබෙන දේවල් අතපත ගෑමක් පමණකි. තම ජීවිත නැවත ගොඩ නගා ගෙන යථා තත්වයට පත්වීමට ඔවුන් දරන ප්‍රයත්නය සහ සාමය පිළිබඳ ඔවුන් තුළ ඇති නොසිඳී ගිය බලාපොරොත්තු රටේ සෙසු පළාත්වලට සහ ගැටුමෙන් හානියට පත් ප්‍රජාවන්ට ද ලබාදිය හැකි වන්නේය. මෙම පර්යේෂණයෙන් උගත් පාඩම් මගින් අනාවරණ වන්නේ දැන ඉගෙන ගැනීමේ සහ ඒවා ප්‍රජාවන් සමඟ බෙදාහදා ගැනීමේ ඇති වටිනාකමයි. මේ සම්බන්ධයෙන් කළයුතු තවත් බොහෝ දේ ඇත.

## 9. පශ්චාත් ගැටුම්වලට අදාළ යුක්තිය පිළිබඳ සංකල්පය කෙරෙහි යළිත් යොමු වීම

මෙම නිගමන ඔස්සේ යමින් ගැටුමින් අනතුරුව යථා තත්වයට පත්වීමේ දී යුක්තියට හිමි වන ස්ථානය පිළිබඳ ව ක්‍රිස්ට්ස් දක්වන අදහස් කෙරෙහි නැවතත් යොමු වීම උචිතය :

> *"ප්‍රචණ්ඩත්වය ඇති කරලීම හේතුවෙන් බිඳී විසුරුණු සමාජයන්ට මෙම භීෂණාත්මක ප්‍රචණ්ඩත්වයන්ට මුහුණ දීම පිණිස එකී අතීත අයථා සිදුවීම් සැලකිල්ලට ගනිමින් යාන්ත්‍රණයන් අනුගත කර ගැනීමට හෝ සැලසුම් කර ගැනීමට අවශ්‍ය වේ. එසේ නොවුනහොත්, අතීතය ජාතීන්ගේ සහ පුද්ගලයන්ගේ වර්තමානය සහ අනාගතය කෙරෙහි නොසිතූ ආකාරවලින් අහිතකර ලෙස බලපෑ හැක. ඉතා අශෝභන ප්‍රචණ්ඩත්වයන්හි ගොදුරු බවට පත්ව සිටි පුද්ගලයන් හෝ කණ්ඩායම් ඒවා හුදෙක් අමතක කර දමන්නේ යැයි හෝ ඔවුනට කිසියම් ආකාරයෙන් යුක්තිය ඉටු වීමකින් තොරව, ඒ පිළිබඳ තම හැඟීම මුලුමනින් ම ඉවත ලනු ඇතැයි උපකල්පනය කිරීම දැඩි නොමනාපකම් සහ අනාගත ගැටුමක බීජ ඉතිරි කර තැබීමකි."*
> *(Kritz N, 1997, p.2)*

පර්යේෂණයට දායක වූ ප්‍රජාවන් ගැටුම හේතුවෙන් බිඳී විසිර ගොස් සිටි අතර, තමන් අත්විඳි භීෂණාත්මක ප්‍රචණ්ඩත්වයන්ට මුහුණ පෑම සඳහා ඔව්හු තමන් විසින් ම ඊට අදාළ යාන්ත්‍රණයන් අනුගත කර ගෙන හා සැලසුම් කර ගෙන සිටි බව පෙනෙන්නට ඇත. මෙම යාන්ත්‍රණයන් ඔවුන්ගේ ප්‍රජාවන් තුළින් ම පැන නැගුණු ඒවා වන අතර, ඒවා පදනම් වී තිබුණේ ඔවුන්ට හුරුපුරුදු හා ඔවුන් තම විශ්වාසය තබා හුන් දේ මතය. ගැටුම්වලින් පසු තරමක කාලයක් ඉකුත් ව ගොස් තිබූ සමයේ කරන ලද පර්යේෂණය මගින් ප්‍රජාවන් තුළ පවත්නා දැඩි නොරිස්සුම් ස්වභාවය නිරාවරණය කිරීමට ප්‍රයත්න නොදැරුණු අතර, ප්‍රතිචාරවලින් දක්වෙන්නේ ඔවුන් තම භීෂණාත්මක ප්‍රචණ්ඩත්වයන් අතුරින් කිහිපයකට මුහුණ දී ඇති බවත්, අනාගත ගැටුමක් පිළිබඳ බීජ ඔවුන් තුළ රැඳී නොමැති බවත් ය. ප්‍රජාවට මෙලෙස කටයුතු කිරීමට හැකි ව තිබූ එක් හේතුවක් වී ඇත්තේ, කාර්යභාරයක් ඉටු කෙරෙන්නේ කුමන ආයතනවලින් ද, අනුගත කරගත යුත්තේ කුමන ක්‍රමයක් ද යන්න නිශ්චය කිරීම ඇතුළත් යථා තත්වයට පත්වීම පිළිබඳ තමන්ට ම උචිත ක්‍රමයක් තෝරා ගැනීමට ඔවුන්ට හැකිව තිබීම බැව් අනුමාන කළ හැක.

හොඳම ක්‍රියාමාර්ගය වන්නේ යථා තත්වයට පත්වීම පිණිස ඔවුන්ගේම මාර්ගයන් අනුගමනය කිරීමට ප්‍රජාවන්ට ඉඩ හැර, ඔවුන් අතැර දමීම යැයි යනුවෙන් මෙම පර්යේෂණය මඟින් කිසි ලෙසකින් හෝ උපදෙස් දෙන්නේ නැත. ඒ වෙනුවට ඒ මඟින් ප්‍රයත්න දරන්නේ ප්‍රජාවන්ට යථා තත්වයට පත්වීම පිළිබඳ තමන්ගේ ම ක්‍රියාවලියන් බිහි කර ගෙන, ඒවා පවත්වා ගෙන යෑමේ හැකියාවක් ඔවුනට තිබෙන බවත්, අනෙකුත් ක්‍රියාකාරීන් විසින් ඒවාට අනුබල දී වඩාත් උසස් මට්ටමකට ඒවා පත් කළ හැකි බවත් දක්වීමටය. ජීවිකා වෘත්තීන් යථා තත්වයට පත් කිරීම, යටිතල පහසුකම් යළි ගොඩ නැංවීම, සහ ගැටුමින් යථා තත්වයට පත්වීම පිළිබඳ සමස්ත ක්‍රියාවලියට දායකවීම ආදී මාර්ගවලින් මෙම ක්‍රියාකාරීන්ට අතිශයින් වැදගත් මෙහෙවරක් ඉටු කළ හැකි ව තිබේ. යථා තත්වයට පත්වීමට අදාළ ස්වකීය ක්‍රියාදාමයන් අඛණ්ඩ ව කරගෙන යෑම පිණිස ඒ මඟින් ප්‍රජාවන්ට වැදගත්, අර්ථාන්විත පදනමක් සැපයෙනු ඇත.

## Bibliography


GALTUNG, J. 1996. Peace by Peaceful Means: Peace and Conflict, Development and Civilization. London: Sage Publishers.

HAYNER, P. 2002. *Unspeakable truths; Facing the Challenge of truth commissions.* New York: Routlege.

KRIESBERG. L. 2001. Changing forms of Coexistence. *In:* ABU-NIMER, M. ed. *Reconciliation, Justice and Co-existence.* Maryland Lexington Books. Pp 47-64.

KRITZ. N. 1997. War crimes tribunals and truth commissions, some thoughts on accountability mechanisms for mass violations of human rights. *After the War is Over What Comes Next? Conference on Promoting Democracy, Human Rights and Reintegration in Post-Conflict Societies* USAID Conference October 30-31 1997. Washing DC. USAID, pp 2-22.

THOMSON-SENANAYAKE, J. 2002. *Between Hostility and Healing; Truth, Accountability and Reconciliation in the context of armed conflict, Options for Justice in Sri Lanaka. Sri Lanka:* National Peace Council.

UNITED NATIONS DEVELOPMENT PROGRAMME, 1994. *New Dimensions in Human Security - Human Development Report.* New York: UNDP.